

# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# ANNUAL REPORT
# 2014

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
## இலங்கை போக்குவரத்துச் சபை
## SRI LANKA TRANSPORT BOARD


අංක: 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05

இல:200,கிருல வீதி,நாராஹேன்பிட்ட, கொழும்பு 05

No: 200, Kirula Road, Narahenpita, Colombo 05




# වාර්ෂික වාර්තාව

# 2014

# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

පටුන

1.දැක්ම, මෙහෙවර ,අරමුණ

2.හැඳින්වීම

3.සභාපතිතුමාගේ පණිවිඩය

4.කාර්යසාධනය සහ ප්‍රගති සමාලෝචනය

5.අවසාන ගිණුම්

6.විගණකාධිපති වාර්තාව

## දැක්ම

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා

## මෙහෙවර

මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායී, සුවපහසු මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවකයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායී කාර්ය මණ්ඩලයක් ආයතනයේ සියළුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

## අරමුණු හා පරමාර්ථ

1. ප්‍රාදේශීය කාර්යාල 12 මගින් ඩිපෝවන් සඳහා උපදෙස් දීමත් ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධීකරණය කිරීම මගින් ගුණාත්මක ප්‍රමාණාත්මක සහ කාර්යක්ෂමව හා ඵලදායී බස් සේවාවක් සැපයීම පිණිස කටයුතු ප්‍රවර්ධනය කිරීම.

2. පාසල් යන ළමයින් සඳහා සතුටුදායක බස් සේවාවක් සැපයීම.

3. මූල්‍යමය ප්‍රතිලාභ නොමැතිවීම හේතුකොටගෙන පෞද්ගලික බස්රථ ධාවකයින් විසින් අතහැරදමා ඇති ආදායම් නොලබන මාර්ගවල බස් සේවා යෙදවීම.

4. කොටුව මධ්‍යම බස් නැවතුම් පොලේ සිට දුර පළාත් වලට දුර ගමන් සේවා සැපයීම.

5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත ආයතන සම්බන්ධීකරණය කිරීම.

6. උත්සව, විශේෂ අවස්ථා, පාර්ලිමේන්තු/ පළාත් සභා මැතිවරණ ආදිය වැනි අවස්ථාවන් වලදී බස් සේවා සම්බන්ධීකරණය කිරීම.

7. තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය කිරීම.

8. බස් ධාවනය සම්බන්ධයෙන් පොකුරු බස් සමාගම්, මහා භාණ්ඩාගාරය, ජාතික ප්‍රවාහ කොමිෂන් සභාව, පළාත් සභා අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

9. ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසැල්වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයීම.

10. රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පීන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.

11. ප්‍රාදේශීය වැඩපොළවලින් නිෂ්පාදනය කරනු ලබන කට්ටල/ උප කට්ටල ඩිපෝවන් වෙත සැපයීම.

12. සිත්ගන්නා සුළු අඩුකල මිල ගණන් වලට වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදීම.

13. පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ මධ්‍යම ගබඩාවක් පවත්වාගන යාම.

14. ඩිපෝවන් වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්ෂක විමර්ශන, හදිසි වැටලීම් සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම.

## හැඳින්වීම

සියලුම ආකාරයේ ප්‍රවාහන මධ්‍යයන් රටේ ආර්ථික සංවර්ධනය සලකා නිසැකවම අත්‍යාවශ්‍ය වේ. මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම අත්‍යාවශ්‍යවන්නකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක නගර සහ ග්‍රාම සම්බන්ධතාවය පවත්වාගැනීම පිණිස ස් සේවාව වැදගත් මෙහෙයක් ඉටුකරන අතර මුළු මහත් රටේම ඒකාබද්ධතාවය එමගින් ඇතිකරයි.

මාර්ග 1200 කට පමණ සම්පූර්ණයෙන් බස්රථ ධාවනයකරන ලද බස්රථ ධාවකයන් 80 දෙනෙකු පමණ විසින් දිවයින පුරා සපයන ලද බස් සේවා ද ලියාපදිංචි කල බස්රථ 3532 ක් ද 1957.10.31 දින 1957 අංක 48 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත මගින් ජනසතු කරන ලද අතර ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය (ලං.ග.ම) 1958.01.01 දින සිට ක්‍රියාත්මක විය.

එවක් පටන් 1977 වර්ෂය දක්වා මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලං.ග.ම ඒකාධිකාරිත්වයකින් ක්‍රියාත්මක වූයේය. 1978 අංක 19 දරණ ගමනාගමන මණ්ඩල ව්‍යවස්ථා මගින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 10ක් පිහිටුවා 1978 දී ලංගම විමධ්‍යගත කරන ලදී.

ප්‍රදේශයේ සහ පළාතේ අවශ්‍යතා පිළිබඳ වැඩි වශයෙන් සංවේදීවීමටත් ප්‍රදේශයේ ප්‍රවාහන ගැටළු සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමටත් කුඩා ඒකකවලට හැකිවන බව අපේක්ෂා කල බැවින්, විමධ්‍යගත කිරීමෙන් මගී ජනතාවගේ අවශ්‍යතා වඩා කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි රජය අදහස් කළේය.

කෙසේ වුවද ලං.ග.ම විසින් දරණ ලද පාඩු දිගින් දිගටමවැඩිවීම නිසාත් නිදහස් ආර්ථිකය පිළිබඳ නව සංකල්ප නිසාත් දිගින් දිගටම වැඩිවෙමින් පැවති මගී ඉල්ලුම සපුරාලීමට නොහැකි වීම නිසාත් මගීන් ප්‍රවාහය කිරීම සඳහා පෞද්ගලික අංශයට ද අවසර ලබාදෙන ලදී.

රජයේ දැඩි විශ්වාසයකින් පෞද්ගලීකරණය මගින් රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටසක් වශයෙන් ලං.ග.ම ජනතාකරණය කිරීමට කටයුතු කළේය. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ලංගම ජනතාකරණය කරන ලදී. ජනතාකරණය සිදු කල අවස්ථාවේදී පැවති ගමනාගමන මණ්ඩලය ඩිපෝ 93ක් වෙන් වෙන් වශයෙන් සීමාසහිත සමාගම් බවට පත්වූ අතර එම සමාගම් පාලනය කිරීම් සඳහා සේවකයන් අතුරෙන් අධ්‍යක්ෂමණ්ඩලයක් තෝරාගන්නා ලදී. එම සමාගම්වල සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් අඩක් කාර්ය මණ්ඩලය වෙත බෙදා දෙන ලද අතර ඉතිරි කොටස් මහා භාණ්ඩාගාරය සතුවිය. ජනතාකරණ වැඩසටහන 1990 වර්ෂයේදී ආරම්භකර 1993 වර්ෂයේදී අවසන් කරන ලදී. ජනතාකරණය අවිධිමත් ලෙස ක්‍රියාත්මක කල බැවින් අපේක්ෂා කල ප්‍රතිඵල අත් නොවිය.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් ඉහත ඩිපෝ ඒකාබද්ධ කර පොකුරු බස් සමාගම් පිහිටුවන ලදී. සේවක අතිරික්තයන්, විනය බරපතල සේ බිඳවැටීම, අසාධාරණ තරඟකාරිත්වය, පාසැල් සේවාවන්, අනාර්ථික සේවාවන් වැනි සමාජමය වගකීම, වෘත්තීමය දැනුමක් ඇති අයගේ හිඟය අකාර්යක්ෂමතාවය, ධාවනය වැය ඉහල යෑම, දේශපාලන හා වෘත්තීය සමිති අනිසි බලපෑම් හා පැතිරී ගිය දූෂනයන් පොකුරු බස් සමාගම් බිඳවැටීමට හේතු වූ සමහර කරුණු වේ.

මෙම ප්‍රශ්ණයට විසඳුමක් වශයෙන් "2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන පනත" මගින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2005.10.19 පිහිටුවන ලදී.

## සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2014 වර්ෂයේ රු. 1,861,604,182 තිබූ මෙහෙයුම් අලාභය 2017 වර්ෂය හා සසඳා බලන විට රු. 2,079,547,613 ක් ලෙස මෙහෙයුම් ලාභයක් බවට ලඟා කර ගැනීමට ශ්‍රී ලංගම සමත්ව ඇති බව ප්‍රකාශ කිරීමට සතුටු වෙමි.

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ 8.2% ක පමණ ප්‍රතිශතයක් ශ්‍රී ලංගම විසන් සපයනු ලබයි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් රට තුල ඇති මාර්ග අවශ්‍යතාවයෙන් ලාභ ලබන හා පාඩු ලබන මාර්ග 1500 ක් පමණ ධාවනය කරමින් රටේ මහජනතාවට සේවය සැපයීමට කැපවී සිටී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2014 වර්ෂයේදී සාමාන්‍යයෙන් දිනකට බස්රථ 4,596 ක් පමණ ධාවනය කළ අතර 2018 වර්ෂය මාර්තු මස වන විට එම අගය 5,250ක් දක්වා වර්ධනය කර ගැනීමට සමත්ව ඇත. ඊට ඉවහල් වූ ප්‍රධාන හේතුවක් වනුයේ 2014 වර්ෂයේදී නව බස්රථ 2200 ක් බස්රථ ඇණියට එකතු වීමයි. ඒ හැරෙන්නට 2017 වර්ෂය තුලදී නව එන්ජින් කට්ටල 500 කට ආසන්න ප්‍රමාණයක් ආනයනය කර සවිකර ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2014 වර්ෂයේදී සිසුසැරිය බස්රථ සේවා 680 ක් ධාවනය කළ අතර, වර්තමානයේදී එම බස්රථ සංඛ්‍යාව 745 ක් දක්වා වර්ධනය වී ඇත. මෙයට අමතරව 2014 වර්ෂයේදී ශ්‍රී ලංගම විසින් අනාර්ථික මාර්ගවල ධාවනය සඳහා ද විශාල බස්රථ ප්‍රමාණයක් යොදවා ඇති අතර වර්තමානය වන විට එම බස්රථ සංඛ්‍යාව තවදුරටත් වැඩිකර ඇත. මෙම සේවාවන් සපයා ඇත්තේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම සම්බන්ධයෙනි. ශ්‍රී ලංගම මේ අයුරින් ග්‍රාමීය මාර්ගවල බස්රථ ධාවනය නිසා සිදුවන පාඩුව පියවා ගැනීමට රජය විසින් මූල්‍ය සහනාධාර සපයනු ලබයි.

2014 වර්ෂයේදී ශ්‍රී ලංගම විසින් දිනකට කි.මී 1,017,086 ක් පමණ බස්රථ ධාවනය කරනු ලැබූ අතර, වර්තමානයේදී එම අගය කි.මී 1,227,800 ක් පමණ වේ. මෙයට ප්‍රධාන හේතුවක් වනුයේ නව බස්රථ ප්‍රමාණයක් රථ ඇණියට එකතු කිරීම වීමත් පැරණි බස්රථ වලට නව එන්ජින් කට්ටල සවිකර කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් රථ ඇණියට එක් කිරීමත්ය. එසේම 2014 වර්ෂයේදී මාර්ග ලේඛන ආදායම කි.මී 01 ට රු 59.14 ක් වූ අතර, වර්තමානය වන විට එම අගය රු 60.68 ක් දක්වා වැඩි වී ඇත.

2014 වර්ෂයේදී මාර්ග ලේඛන ආදායම දිනකට රු. 60,154,705 ක් වූ අතර, 2018 වර්ෂය වන විට එම ආදායම රු. 74,442,500 ක් දක්වා වැඩි වී ඇත. මෙම වැඩිවීමට ප්‍රධාන හේතූන් වනුයේ ශ්‍රී ලංගම රථ ඇණිය ශක්තිමත් කරමින් ඉහල කළමනාකරණ කාර්යක්ෂමතාවයක් දක්වා ශ්‍රී ලංගම රැගෙන යාමට වර්තමානය වන විට හැකි වීමයි.

2014 වර්ෂයේදී බෙහෝ ඩිපෝ පාඩු ලබමින් ක්‍රියාත්මක වූ අතර වර්තමානය වන විට එම බොහෝ ඩිපෝවන් ලාභ ලබන තත්වයට පත්ව ඇත. එසේම දැනට සියළුම ඩිපෝ මාසික සේවක වැටුප් නියමිත දිනට ගෙවනු ලබන අතර මෙය ප්‍රශංසනීය ජයග්‍රහණයක් බව මම විශ්වාස කරමි. මීට ප්‍රධාන හේතුවක් ලෙස ශ්‍රී ලංගමට හඳුන්වා දුන් සිය කැමැත්තෙන් විශ්‍රාම යාමේ ක්‍රියාපරිපාටිය හේතුවෙන් සේවක වැටුප් වැඩි ප්‍රමාණයක් අඩුවීමත්ය.

*සභාපති*
*ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය*

## මානව සම්පත් කළමනාකරණ කොට්ඨාශය

| **2014 වර්ෂයෙහි ලබාදුන් රියදුරු/ කොන්දොස්තර නව පත්වීම් පිළිබඳ විස්තර වාර්තාව** | | |
|---|---|---|
| **රියදුරු සංඛ්‍යාව** | **කොන්දොස්තර සංඛ්‍යාව** | **එකතුව** |
| **1532** | **1702** | **3234** |

| ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2014 වර්ෂයේ ලබාදී ඇති නව පත්වීම් කාර්තුමය වශයෙන් | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | තනතුර | 2014.01.01 සිට 2014.03.31 | 2014.04.01 සිට 2014.06.30 | 2014.07.01 සිට 2014.09.30 | 2014.10.01 සිට 2014.12.31 | එකතුව |
| 1 | ආරක්ෂක නියාමක | 0 | 0 | 2 | 1 | 3 |
| 2 | සියළු කම්කරු | 55 | 0 | 3 | 51 | 109 |
| 3 | කාර්යාල කාර්ය සහායක | 0 | 0 | 1 | 1 | 2 |
| 4 | කොන්දොස්තර | 285 | 256 | 475 | 686 | 1702 |
| 5 | ගිණුම් ලිපිකරු | 1 | 0 | 2 | 6 | 9 |
| 6 | ජංගම පරීක්ෂක | 2 | 0 | 4 | 14 | 20 |
| 7 | කාර්මික | 45 | 13 | 4 | 33 | 95 |
| 8 | පරිගණක ක්‍රියාකරු | 2 | 0 | 2 | 3 | 7 |
| 9 | රියදුරු | 265 | 216 | 381 | 670 | 1532 |
| 10 | ලිපිකරු | 9 | 1 | | 49 | 68 |
| 11 | ආරක්ෂක පරීක්ෂක | 0 | 0 | 1 | 0 | 1 |
| | | 664 | 486 | 884 | 1514 | 3548 |

විධායක/ විධායක නොවන සේවකයින්ගේ සේවය දීර්ඝ කිරීම - 2014

| | |
|---|---|
| කොන්ත්‍රාත් පදනම මත | 107 |
| කාර්ය පැවරුම් මත | 13 |
| සේවය දීර්ඝ කිරීම් | 5 |
| එකතුව | 125 |

විධායක පත්වීම් පිළිබඳ විස්තරය - 2014

| | 2014 |
|---|---|
| ස්ථිර පත්වීම් | 20 |
| ආවරණ පත්වීම් | 106 |
| උසස්වීම් | 39 |
| ආවරණ පත්වීම් ස්ථිර කිරීම | 64 |
| ස්ථාන මාරුවීම් | 133 |
| කොන්ත්‍රාත් පත්වීම් | 13 |
| නව බඳවා ගැනීම් | 03 |

2014.12.31 දිනට ශ්‍රී ලංගම සිටින සේවක සංඛ්‍යාව

| | 2014.12.31 දිනට |
|---|---|
| විධායක | 1154 |
| විධායක නොවන | 8149 |
| රියදුරු | 10027 |
| කොන්දොස්තර | 10272 |
| කාර්මික | 5089 |
| පුහුණු | 78 |
| එකතුව | 34769 |

2014 වර්ෂයේ නැවත රැකියා පිළිබඳ සාරාංශය

| අනු අංකය | තනතුර | ප්‍රතිෂ්ඨාපනය | කොන්ත්‍රාත් | එකතුව |
|---|---|---|---|---|
| 1 | රියදුරු | 39 | 37 | 76 |
| 2 | කොන්දොස්තර | 5 | 26 | 31 |
| 3 | කාර්මික | 9 | 14 | 23 |
| 4 | රිය/කොන්/කාර් හැර | 7 | 14 | 21 |
| | එකතුව | 60 | 91 | 151 |

## ලේකම් කොට්ඨාශය

**<u>ශ්‍රී ලංකා ගමනාගමන මන්ඩලයේ අධක්‍ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අදාල කටයුතු</u>**

2014 වර්ෂය තුල විශේෂඅධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමක් හා හදිසි අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමක්ද සහිතව අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් 14ක් පැවැත්වීමට අදාල කටයුතු ඉටුකර ඇත. ඒ යටතේ,

1. අධක්‍ෂ මණ්ඩල රැස්වීම පැවැත්වෙන දිනය සඳහන් කර සියලුම අධ්‍යක්‍ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත හා ශ්‍රී ලංගම කොට්ඨාශ/ අංශ ප්‍රධානීන් වෙත නිවේදන නිකුත් කිරීම.

2. අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකා භාරගෙන පත්‍රිකා අංක යොදා ලේඛණගත කිරීමෙන් අනතුරුව ගොනු සකසා, අධ්‍යක්‍ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත භාරදීම.

3. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කෙරෙන අධ්‍යක්‍ෂ මණ්ඩලීය පත්‍රිකා පිළිබඳව හා චක්‍ර ලිපි පිළිබඳව සඳහන් කර අධ්‍යක්‍ෂ මණ්ඩලීය රැස්වීමේ න්‍යාය පත්‍රය සැකසීම.

4. න්‍යාය පත්‍රයට අනුව හා සභාපතිතුමාගේ උපදෙස් මත අධ්‍යක්‍ෂ මණ්ඩලීය පත්‍රිකා හා චක්‍රලිපි සභාගත කිරීම.

5. ඒ ඒ අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකාවට හා චක්‍ර ලිපියට අදාලව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ලබාදෙන තීරණය හා ආනුෂංගික උපදෙස් නිවැරදිව වාර්තා කර අධ්‍යක්‍ෂ මණ්ඩලයේ තීරණ අයිතම අංක අනුව සටහන් කිරීම.

6. එසේ සටහන් කල අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයන් වලට අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය ලද පසු එම අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයන් වල උධෘතයන් එම අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයන් ක්‍රියාත්මක කල යුතු ශ්‍රී ලංගම කොට්ඨාශ ප්‍රධානීන්/ අංශ ප්‍රධානීන් වෙත භාරදීම.

7. මෙම සියලුම කටයුතු නිවැරදිව, රහස්‍යභාවයෙන් යුතුව හා විධිමත්ව ඉටු කිරීම.

8. ශ්‍රී ලංගම අධ්‍යක්‍ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත හා අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වලට ආරාධනා ලද කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් වෙත සංග්‍රහ ලබාදීම.

9. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගිවන (ශ්‍රී ලංගම නිලධාරීන් නොවන) අධ්‍යක්‍ෂ මණ්ඩලීය සාමාජිකයන්ට සහභාගීත්ව දීමනා ගෙවීමේ කටයුතු සිදු කිරීම.

10. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වන (ශ්‍රී ලගංම නිලධාරීන් නොවන) අධ්‍යක්‍ෂ මණ්ඩලීය සාමාජිකයන්ට ප්‍රවාහන දීමනා ගෙවීමේ කටයුතු සිදු කිරීම.

**2014වර්ෂයෙහි පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර ගණන**

01 වන රැස්වීම - 2014.01.30
02 වන රැස්වීම - 2014.03.28
03 වන රැස්වීම - 2014.05.08
04 වන රැස්වීම - 2014.05.30
05 වන රැස්වීම - 2014.06.19
06 වන රැස්වීම - 2014.07.18
07 වන රැස්වීම - 2014.08.22
08 වන රැස්වීම - 2014.09.30
09 වන රැස්වීම - 2014.10.28
10 වන රැස්වීම - 2014.11.18
11 වන රැස්වීම - 2014.12.12

2014 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වූ වාර ගණන - 11 යි

<u>ශ්‍රී ලංකා ගමනාගමන මන්ඩලයේ ඉඩකඩම් වලට අදාල කටයුතු ඉටු කිරීම</u>

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට බස් සමාගම් ජනසතු කිරීමේදී පවරාගත් හා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කරගත් සහ මිලදීගත් ඉඩම් මෙන්ම රජයෙන් හා අදාල ඉඩම් බලතල ඇති ආයතන වෙතින් බදු ලබාගෙන ඇති ඉඩම් සම්බන්ධයෙන් ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සභාපතිතුමා, උප සභාපතිතුමා සහ ප්‍රධාන විධායක නිලධාරීතුමා යන ඉහල කළමණාකාරිත්වයේ උපදෙස් පරිදි මූලික පරිපාලන කටයුතු ඉටු කිරීම ලේකම් කොට්ඨාශයේ ප්‍රධාන කාර්ය භාරය වේ. ඒ අනුව,

1. ශ්‍රී ලංගම ඉඩම් සම්බන්ධයෙන් ගැටලු ඇති වූ විට හා එම ඉඩම් භාවිතය සම්බන්ධයෙන් උපදෙස් අවශ්‍ය වූ විට අදාල සවිස්තර කරුණු අන්තර්ගත කර අධ්‍යක්ෂ මණ්ඩලීය පත්‍රිකා සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු වාර්තා කිරීම හා එම අධ්‍යක්ෂ මණ්ඩලීය පත්‍රිකාවලට අදාල තීරණ ක්‍රියාත්මක කිරීම.

2. ශ්‍රී ලංගම භාරයේ ඇති බොහෝ ඉඩම් විධිමත් ලෙස අත්කරගෙන හා පවරාගෙන නැති බැවින්, අදාල අත්කර ගැනීමේ කටයුතු සහ පවරා ගැනීමේ කටයුතු ඒ සම්බන්ධ පනත් යටතේ සිදු කිරීමට රජයේ විවිධ පාර්ශවයන් සමග සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.

3. ප්‍රවාහන අමාත්‍යාංශය හා ප්‍රවාහන ඇමතිතුමා විසින් ඉල්ලා සිටිනු ලබන ඉඩම් සම්බන්ධ වාර්තා සකසා ඉදිරිපත් කරීම.

4. ශ්‍රී ලංගමය භාරයේ පැවති ද අදාල ඉඩම් අවසාන වශයෙන් ශ්‍රී ලංකා ජනරජයට අයත් බවට නෛතික නියමයක් පවතී. ඒ අනුව රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයට අනුව ඉඩම් අමාත්‍යාංශය, ප්‍රවාහන අමාත්‍යාංශය හා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ ශ්‍රී ලංගමය පාර්ශවයෙන් සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.

5. ශ්‍රී ලංගම ඉඩම් සම්බන්ධයෙන් නෛතික ගැටලු ඇති වූ විට අධිකරණය වෙත පෙනී සිට ශ්‍රී ලංගමයට ඇති අයිතිය තහවුරු කිරීමට කටයුතු කිරීම.

6. ශ්‍රී ලංගම ඉඩම් වලට බාහිර පාර්ශවයන් වෙතින් තර්ජන ඇති වූ විට අදාල පොලිස් ස්ථාන වෙත පැමිණිලි කිරීම හා ඒ සම්බන්ධ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීම.

7. ශ්‍රී ලංගම ඉඩම් මිනින්දෝරු මගින් හා බලයලත් මිනින්දෝරුවරුන් ලවා මැනීමට අදාල කටයුතු ඉටු කිරීම.

8. අවශ්‍ය අවස්ථාවලදී ශ්‍රී ලංගම ඉඩම් කොටස් සඳහා තක්සේරු වාර්තා ලබාගැනීම.

9. ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත බාහිර පාර්ශවයන්ට බදු ලබාදී ඇති ඉඩම් වලට අදාලව බදු කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම.

10. ශ්‍රී ලංගම ඉඩකඩම් සම්බන්ධයෙන් ශ්‍රී ලංගම නිලධාරීන් අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම හා ඉඩම් වලට අදාලව ශ්‍රී ලංලගම නිලධාරීන් වෙත උපදෙස් හා තොරතුරු ලබාදීම.

## ධාවන කොට්ඨාශය

<u>බස් රථ ධාවනය තුලින් ලබා ගෙන ඇති ප්‍රගතිය</u>

ශ්‍රී ලංගමය විසින් 2014 වර්ෂයේ දිනකට මගීන් මිලියන 1.9 ක් පමණ ප්‍රවාහනය කර ඇති අතර, එම මට්ටම පවත්වාගෙන යාමට හැකි වී ඇත්තේ දිනකට බස්රථ 5,000 ක් පමණ ධාවනය කරවමිනි. මෙම බස්රථ යොදා ගනිමින් ආදායම් සහිත මාර්ග වල හා අනාර්ථික මෙන්ම අලුයම සහ රාත්‍රී11.00 වශයෙන් විවිධ වූ පොදු ප්‍රවාහන සේවාවක් මුළු දිවයින පුරා පවත්වාගෙ යාමට ශ්‍රී ලංගමය ඇපකැප වී සිටී. මීට අමතරව කාර්යාල හා පාසල් ළමුන් සඳහා ම වෙන්වූ බස්රථ සේවා ද ලබාදීමට කටයුතු කර ඇත.

- ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ ප්‍රවාහන පහසුකම් සපුරාගැනීමට යාමේදී ශ්‍රී ලංගමය මගින් විවිධ පහසුකම් හඳුන්වා දී ඇත. ඒ අනුව, Low Floorබස්රථ නගර ආශ්‍රිතව ක්‍රියාවට නැංවීම සිදු කළ අතර මේ වන විට එම රථ ඇණිය කිරිබත්ගොඩ - පානදුර/ මොරටුව - කොළඹ/ මීගමුව - කොළඹ මාර්ග වලද, දක්ෂිණ හා කටුනායක අධිවේගී මාර්ග යොදාගනිමින් මෙම සේවාව සපයමින් සිටී. මෙයට අමතරව ශ්‍රී ලංගම සෑම බස්රථයකම ආබාධිත පුද්ගලයින්ට ආසන පහසුකම් ලබාදීම සඳහා ආසන වෙන්කිරීමක් සිදුකර ඇත.

- පොදුරාජ්‍ය මණ්ඩල සමුළුවට සමගාමීව ශ්‍රී ලංගමය වෙත අධි සුඛෝපභෝගී බස්රථ68 ක් ලැබුණු අතර, මෙම බස්රථ ශ්‍රී ලංගම අධි සුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවය නමින් අංශයක් පිහිටුවා මෙහෙයුම් කටයුතු සිදුකරගෙන යනු ලබයි.

- පොදු ප්‍රවාහන සේවා සඳහා නවතම තාක්ෂණ මෙවලම් භාවිතය ඉහළ නංවාලීමේ ශ්‍රී ලංගම තවත් අරමුණක් අනුව ත්‍රෛයි භාෂාවෙන් ඉලෙක්ට්‍රොනික් ඩිජිටල් නාම පුවරු සවිකිරීම ආරම්භ කර බස්රථ 2,200 සඳහා ද මෙම නාම පුවරු සවිකර ලබාගැනීමට කටයුතු කර ඇති අතර, ඉදිරි කාල සීමාවන්හිදී මිලට ගැනීමට නියමිත සියළුම බස්රථ ද මෙම පහසුකම් සහිතව ලබාගැනීමට තීරණය කර ඇත.

- ඉලෙක්ට්‍රොනික් ටිකට් යන්ත්‍ර හඳුන්වාදීම බස්නාහිර පළාත තුල හා යටිනුව ඩිපෝව, දකුණු පළාත, පුත්තලම දිස්ත්‍රික්කය තුල සම්පූර්ණ කර ඇත.

- ශ්‍රී ලංගම බස්රථ වල ඉලෙක්ට්‍රොනික ටිකට් යන්ත්‍ර 2,800 යෙදවීම.

- තොරතුරු තාක්ෂණය පොදු ප්‍රවාහන සේවාවේ කාර්යක්ෂම බවට පත්කිරීමේ ප්‍රතිපත්තියට අනුව යමින් ඉලෙක්ට්‍රොනික වාර ප්‍රවේශපත්‍ර භාවිතයට සිසුන් හුරු කිරීම ආරම්භ කර ඇත. පාසල් තුනකින් ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය කොළඹ, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික්ක ද දකුණු පළාතේ කතරගම ප්‍රදේශය ආවරණය වන පරිදි පාසල් 85 ක් තුල ව්‍යාප්ත කර ඇත.මෙම වාර ප්‍රවේශපත්‍ර හිමි සිසුන් සංඛ්‍යාව 12,000 ක් පමණ දක්වා ඉහල දැමීමට ශ්‍රී ලංගම සමත් වී ඇත.

- සිසු සැරිය බස් සේවාව යටතේ බස්රථ 662 ක් ධාවනයට එක් කර ඇත.

- 2012, 2013 හා 2014 වර්ෂයන් සැලකීමේදී 2014 වර්ෂයේ තම මාර්ග ලේඛන ආදායම පෙර වර්ෂවලට සාපේක්ෂව ඉහල නංවා ගැනීමට ශ්‍රී ලංගමය සමත් වී ඇත. ඒ අනුව මෙය 2014 වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 2,330.80 කින් තම ආදායම ඉහල නංවා ගැනීම සිදුකර ඇත.

සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය

- **අලුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන් වාර ධාවනය**
  ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශයක්ම ආවරණය වන පරිදි අලුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන් වාර සැපයීම තුලින් රටේ ආර්ථිකයේ ශ්‍රම බලකාය සංචලනයට දායක වන නමුත් මෙම සේවාව මගින් ශ්‍රී ලංගමයට අතීතයේ සිට හිමිව ඇති ලාභයක් නොමැති තරම් වේ. නමුත් ශ්‍රී ලංගම සිදුකරනු ලබන තවත් සමාජයීය වගකීමක් ලෙස සලකා බලා සේවාව අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

- **ග්‍රාමීය ප්‍රදේශයන්හි බස්රථ ධාවනය**
  ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීම සඳහා ගම හා නගරය යා කිරීමේ ප්‍රබලතම ගමනාගමන මාධ්‍ය ලෙස ක්‍රියාත්මක වන සේවාද අලාභදායී තත්වයන් යටතේ සිදු කරයි. ඒ අනුව 2013 වර්ෂයේ මිලට ගත් කුඩා බස්රථ 281 ක් උපයෝගී කරගනිමින් ග්‍රාමීය මාර්ග සේවා තරකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත. තවදුරටත් මෙම කුඩා බස්රථ මිලට ගනිමින් මෙම සේවාව තර කිරීමට පියවර ගනිමින් සිටිනුයේ එය මේ රටේ ග්‍රාමීය ආර්ථිකයේ ස්වාධීනත්වයට අත්‍යාවශ්‍ය සේවාවත් බැවිනි.

- **පාසැල් සේවා බස්රථ ධාවනය**
  ශ්‍රී ලංගම මගින් දරණ බරපැන තුලින් දැයේ හෙට දිනය වෙනුවෙන් සමාජ ප්‍රතිලාභ ඇති කිරීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව මගී තදබදය අධික සහ ලාභ ඉපයීම සිදුකර ගත හැකි අවස්ථා රැසක් අහිමි කරගනිමින් වුවද අප සතුව ඇති සීමිත බස් රථ ඇණිය තුල වැඩි ඉඩකඩක් දැයේ අනාගත පරපුර වන පාසල් සිසු දරු දැරියන් නියමිත වේලාවට පාසලට ගෙන යාම සහ නිවසට ගෙන ඒම සඳහා වෙන්කර ඇති අතර මෙයද ශ්‍රී ලංගමයේ තවත් ජාතික මෙහෙවරකි.

- **ජාතික උත්සව අවස්ථා වල සිදුකරනු ලබන බස්රථ ධාවනය**
  සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය, වෙසක් හා පොසොන් උත්සවය, මහනුවර හා කතරගම ඇසළ පෙරහැර උත්සවය, වාර්ෂික මඩු හා තලවිල මංගල්‍යය, ශ්‍රී පාද වන්දනා සමය වැනි ආගමික වශයෙන් වැදගත් දිනයන් සඳහා සිදු කරනු විශේෂ බස්රථ සේවා ශ්‍රී ලංගමය මගින් සමාජ සත්කාරක සේවයක් ලෙස ක්‍රියාත්මක වේ.

- **වාර ප්‍රවේශ පත්‍ර සේවා**
  පාසැල්, විශ්ව විද්‍යාල හා වැඩිහිටි වශයෙන් වෙන් කරමින් විවිධ මට්ටම් තුලින් ප්‍රවාහන අවශ්‍යතා ලබාදීමට ශ්‍රී ලංගම ගෙන ඇති ක්‍රියාමාර්ග මගින් රටේ සිටින මගී ජනතාවට ආර්ථික වශයෙන් සහන සැලසීම සිදුකරයි. මහින්ද චින්තන ප්‍රතිපත්ති අනුව යමින් පැරණි වාර ප්‍රවේශපත්‍ර වෙනුවට නවීන තාක්ෂණික ඉලෙක්ට්‍රොනික වාර ප්‍රවේශපත්‍රයන් හඳන්වාදීම ශ්‍රී ලංගම මගින් ආරම්භ කර ඇති අතර, මේ වන විට කොළඹ, ගම්පහ, කළුතර හා කතරගම යන ප්‍රදේශ වල මෙම ක්‍රමය හඳුන්වා දී ඇත.

- **අධිවේගී මාර්ගයන් තුල ප්‍රවාහන සේවා**
  ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතියට අලුතින් හඳුනාව දුන් අධිවේගී මාර්ග පද්ධතිය තුල ධාවනය කිරීමට නිර්දේශිත බස්රථ යොදාගනිමින් මගී ප්‍රවාහන කටයුතු වල නියැලීමට ශ්‍රී ලංගමය සමත් වී ඇත. ඒ අනුව වර්තමානයේ ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග පද්ධතිය හරහා ගමන් කරනු ලබන අපගේ සුඛෝපභෝගී බස්රථ පද්ධතිය නවීන ලෝකයට ගැලපෙන පරිදි සකස් වී ඇත.

- **සමාන්තර මගී සේවා හදිසි බිඳ වැටීම් වලදී ශ්‍රී ලංගම සේවා**
  සමාන්තර ප්‍රවාහන සේවාවන්හි විටින් විට සිදුවන අඩපන වීම් තුල අසරණ වන මගී ජනතාවට විශේෂ සහන සේවා සපයන්නේද ශ්‍රී ලංගමයයි. ශ්‍රී ලංගම සතුව රථ ඇණිය ගමේත් නගරයේත් ධාවනය කරමින් විවිධ අවස්ථා වලදී අසරණ වන ජනතාවට ප්‍රවාහන පහසුකම් සලසයි.

- පසුගිය වර්ෂ කිහිපය සැලකීමේදී දිනකට ධාවනයට ලබාදී ඇති බස්රථ ප්‍රමාණය හා දිනකට ධාවනය කළ බස්රථ ප්‍රමාණය ඉහළ යාමක් පෙන්නුම් කරයි. 2012 හා 2013 වර්ෂ වල දෛනිකව ධාවනය කළ බස්රථ ප්‍රමාණයේ සාමාන්‍ය බස්රථ 4,361 ක් විය. එම මට්ටම 2014 දී ද නිසි පරිදි පවත්වාගෙන ගොස් ඇත.

- 2014 වර්ෂය අවසාන වන විට දිනකට ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය රු. 1,005,908/- වශයෙන් සාමාන්‍යක් පවත්වා ගෙන ගොස් ඇත. පසුගිය වර්ෂ සැලකීමේදී ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය දිගින් දිගටම ඉහල ගොස් ඇත.

**ජංගම පරීක්ෂණ අංශය**

**2014 වර්ෂය තුල ජංගම පරීක්ෂණ ප්‍රගති වාර්ථාව (දිවයින පුරා)**

| මාසය | කණ්ඩායම් ගණන | පරීක්ෂණ වාර ගණන | පරීක්ෂා කළ බස්රථ සංඛ්‍යාව | බරපතල විෂමාචාර (IV) | සුළු විෂමාචාර (V) | දඩ ගෙවූ මගීන් ගණන | අයකර ගත් දඩ මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 96 | 1,050 | 15,891 | 119 | 323 | 708 | 240,482.00 |
| පෙබරවාරි | 91 | 993 | 14,872 | 120 | 324 | 636 | 220,051.00 |
| මාර්තු | 102 | 1,047 | 15,354 | 113 | 363 | 681 | 237,846.00 |
| අප්‍රේල් | 121 | 1,151 | 16,957 | 114 | 326 | 731 | 255,405.00 |
| මැයි | 97 | 1,005 | 15,725 | 115 | 316 | 654 | 214,075.00 |
| ජූනි | 91 | 1,016 | 15,141 | 103 | 294 | 553 | 182,269.00 |
| ජූලි | 103 | 969 | 16,457 | 89 | 265 | 544 | 190,672.00 |
| අගෝස්තු | 65 | 1,034 | 15,094 | 60 | 220 | 379 | 132,578.00 |
| සැප්තැම්බර් | 117 | 959 | 13,587 | 68 | 225 | 408 | 141,057.00 |
| ඔක්තොම්බර් | 95 | 1,051 | 15,402 | 116 | 251 | 498 | 182,189.00 |
| නොවැම්බර් | 81 | 1,056 | 14,902 | 113 | 243 | 480 | 162,261.00 |
| දෙසැම්බර් | 45 | 854 | 12,253 | 65 | 166 | 329 | 111,536.00 |
| | 1,104 | 12,185 | 181,635 | 1,195 | 3,316 | 6,601 | 2,270,421.00 |

**2014 වර්ෂය තුල ජංගම පරීක්ෂණ ප්‍රගති වාර්ථාව (මධ්‍යම ජංගම අංශය)**

| මාසය | කණ්ඩායම් ගණන | පරීක්ෂණ වාර ගණන | පරීක්ෂා කළ බස්රථ සංඛ්‍යාව | බරපතල විෂමාචාර (IV) | සුළු විෂමාචාර (V) | දඩ ගෙවූ මගීන් ගණන | අයකර ගත් දඩ මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 11 | 191 | 3,549 | 50 | 69 | 323 | 105,180.00 |
| පෙබරවාරි | 11 | 130 | 2,533 | 40 | 52 | 224 | 72,938.00 |
| මාර්තු | 12 | 135 | 2,757 | 43 | 51 | 228 | 76,263.00 |
| අප්‍රේල් | 12 | 155 | 2,985 | 45 | 46 | 227 | 76,411.00 |
| මැයි | 12 | 164 | 3,182 | 57 | 53 | 240 | 75,956.00 |
| ජුනි | 12 | 164 | 2,296 | 43 | 58 | 219 | 74,837.00 |
| ජූලි | 11 | 141 | 2,569 | 36 | 41 | 177 | 59,741.00 |
| අගෝස්තු | අගෝස්තු මස 01 වන දා සිට මධ්‍යම ජංගම පරීක්ෂණ අංශය විසුරුවා හැර ඇති අතර, සැප්තැම්බර් මස 01 වන දා සිට නැවත ස්ථාපිත කරන ලදී. | | | | | | |
| සැප්තැම්බර් | 05 | 33 | 648 | 25 | 12 | 60 | 20,968.00 |
| ඔක්තොම්බර් | 05 | 86 | 1,585 | 62 | 43 | 144 | 52,878.00 |
| නොවැම්බර් | 05 | 87 | 1,515 | 65 | 40 | 144 | 53,378.00 |
| දෙසැම්බර් | 05 | 80 | 1,199 | 31 | 22 | 86 | 26,650.00 |
| | 101 | 1,366 | 25,448 | 497 | 487 | 2,072 | 695,200.00 |

**මාධ්‍ය අංශය**

1. 2014 වසරේදී ප්‍රවාහනයේ නිල ප්‍රකාශනය වන නිබඳ සැරිසර පුවත්පතේ කලාප 03ක් පල කිරීම හා ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් සියළුම ආයතනයන්හි සේවක සේවිකාවන් හට අලෙවි කිරීම.

2. දිනපතා පුවත්පත් වල පළවන ශ්‍රී ලංගම සම්බන්ධ පුවත් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම හා අදාල තොරතුරු සහිත පුවත්පත් වාර්තා සංරක්ෂණය කිරීම, ශ්‍රී ලංගමට අදාල මාධ්‍ය නිවේදන හා ප්‍රවෘත්ති වාර්තා සකස් කිරීම හා නිකුත් කිරීම.

3. ශ්‍රී ලංගම විශේෂ උත්සව සඳහා මාධ්‍ය ආවරණය සැපයීම හා නිවේදන කටයුතු මෙහෙයවීම විශේෂ ප්‍රවෘත්තීන් ජනමාධ්‍යන්හි ප්‍රචාරණය කිරීමට කටයුතු කිරීම.

4. ශ්‍රී ලංගම මගින් මහජනයා වෙනුවෙන් ක්‍රියාත්මක කර ඇති හා සිදු කිරීමට නියමිත විශේෂ ව්‍යාපෘති පිළිබඳ විස්තර මාධ්‍ය මගින් දැනුවත් කිරීමට පියවර ගැනීම සහ ශ්‍රී ලංගම පිළිබඳ යහපත් ආකල්පයන් ජනතාව තුල ඇති කරමින් ශ්‍රී ලංගම ආදායම ප්‍රවර්ධනය කිරීමට දායක වීම.

5. ශ්‍රී ලංගම සම්බන්ධ සියළුම කැඳවීම් හා බඳවා ගැනීම් සම්බන්ධ පුවත්පත් දැන්වීම් රජයේ පුවත්පත් වල පල කිරීම සඳහා කටයුතු කිරීම.

6. මාධ්‍ය ඒකකය යටතේ ක්‍රියාත්මක වන නියෝජ්‍ය වාණිජ අධිකාරී කාර්යාලයේ ශ්‍රී ලංගම සංචාරක නිවාස, ශාලිකා ක්‍රීඩා පිටිය හා ශාලිකා ශාලාව සම්බන්ධ සියළු කටයුතු පාලනය හා සුපරීක්ෂණය කිරීම.

7. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ පුස්තකාලය පවත්වාගෙන යාම සහ ඊට අදාල සියළුම පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම.

**කාර්මික අංශය**

**<u>බස්රථ ඇණිය පවත්වාගෙන යාම සඳහා අලුත්වැඩියා කරන ලද එන්ජින්, ගියර් පෙට්ටි, බස්බොඩි සහ වෙනත් ද්‍රව්‍ය ප්‍රමාණයන් පහත දක්වා ඇත.</u>**

| | |
|---|---|
| අලුත්වැඩියා කළ එන්ජින් ප්‍රමාණය | 613 |
| අලුත්වැඩියා කළ ගියර් පෙට්ටි ප්‍රමාණය | 413 |
| අලුත්වැඩියා කළ බස් බොඩි ප්‍රමාණය | 272 |
| ලබාගන්නා ලද නව බස්රථ ප්‍රමාණය | 1937 |
| අම්පාර ටයර් කර්මාන්ත ශාලාව මගින් නිපදවන ලද පෙරසවි ටයර් ප්‍රමාණය | 12191 |
| අලුත්වැඩියා කළ බස්බොඩි කොටස් | 3204 |
| අලුත්වැඩියා කළ ඉන්ධන පොම්ප | 413 |

**ආරක්ෂක අංශය**

1. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගම අයත් ආයතනයන් වෙත ආරක්ෂාව සැපයීම.

2. ශ්‍රී ලංගම අයත් ප්‍රාදේශීය කාර්යාලයන්, ඩිපෝවන්, උප ඩිපෝවන්, ප්‍රාදේශීය වැඩපලවල් හා රියදුරු අභ්‍යාස විද්‍යාලය යන සියලුම සේවා ස්ථානයන්ට අයත්ව ඉදිරිපත් කරන ලද ලිඛිත පැමිණිලි හා මගී ජනතාව මගින් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනයන් සිදු කිරීම.

3. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගමට අයත් ආයතනයන් වෙත ගිනි නිවන උපකරණ සැපයීම/ අළුත්වැඩියා කිරීම/ අධීක්ෂණය කිරීම්.

4. ශ්‍රී ලංගම අයත් නඩු ඇපකරයන් වලට මුදල් බැඳීමේදී හා ප්‍රධාන කාර්යාලය සතුව කෙරෙන මූල්‍ය කටයුතු සඳහා දෛනික වශයෙන් ආරක්ෂාව ලබාදීම.

5. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ඇතුලු සියලුම සේවා ස්ථානයන් වල සේවක මහත්ම/ මහත්මීන් වෙත නිදහස් ගමන් බලපත්‍ර බෙදා හැරීම් කටයුතු සිදු කිරීම.

6. ශ්‍රී ලංගමට අයත් ආයතනයන්හි වැදගත් ස්ථාන හා ප්‍රභූ ආරක්ෂාව සැපයීම, රථ වාහන නැවැත්වීම, පාලනය කිරීම අදාල ආයතනයන් වෙත කරනු ලබන සියලුම සැපයීම් හා නිකුත් කිරීම් අධීක්ෂණය කිරීම.

7. ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් ආයතන වෙත එනම්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ප්‍රවාහන අමාත්‍යාංශය, ජාතික වෛද්‍ය මධ්‍යස්ථානය වෙත ආරක්ෂාව සැපයීම හා එමගින් ආදායමක් ඉපැයීම.

**විශේෂ විමර්ශණ ඒකකය**

| වර්ෂය | නිම කර ඇති විමර්ශන |
|---|---|
| 2014 | 100 |

**තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ කොට්ඨාශය**

1. පරිගණක 100 ක් මිලදී ගැනීම.
2. මුද්‍රණ යන්ත්‍ර 50 ක් මිලදී ගැනීම.
3. UPS යන්ත්‍ර 150 ක් මිලදී ගැනීම. ව්‍යාපෘතිය
4. Electronic Bus Ticket Machine 2200 මිලදී ගැනීම.
5. Local Area Network ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
6. අවසාන ගිණුම් සැදීමේ මෘදුකාංගය මිලදී ගැනීම.
7. Salary System මෘදුකාංගය ක්‍රියාවට නැංවීම.
8. අදාල මෘදුකාංග සඳහා ලංගම සේවකයින් පුහුණු කිරීම.
9. දිනපතා ප්‍රධාන කාර්යාලයේ හා ශ්‍රී ලංගම ඩිපෝවන් හි ඇති වන පරිගණක හා ඒ ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීම හා ඒවා නිසි ආකාරයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය හා කළමනාකරණය කිරීම.

**සැලසුම් අංශය**

1. අයවැය පාදක කරගනිමින් ඉදිරි වර්ෂ 05 ක් සඳහා සංයුක්ත සැලසුම් සකස් කිරීම.
2. අයවැ පාදක කරගනිමින් ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම.
3. ක්‍රියාකාරී සැලසුමට අදාලව මාසික ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.
4. ක්‍රියාකාරී සැලසුමට අදාල කාර්තු ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.
5. ප්‍රවාහන අමාත්‍යාංශය මගින් ඉල්ලුම් කරන විවිධ වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම.
6. ශ්‍රී ලංගම මහ බැංකුව හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් ඉල්ලුම් කරන වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම.
7. අනිකුත් රාජ්‍ය ආයතන මගින් ඉල්ලුම් කරන වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම.
8. මාසික ලාභාලාභ වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කිරීම.

9. මාසිකව ලාභාලාභ වාර්තාවට අදාල සාරාංශ පිළියෙල කර ඉදිරිපත් කිරීම.

10. මාසික වාර ප්‍රවේශපත්‍ර වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කිරීම.

11. බැරකම් වාර්තා ඉදිරිපත් කිරීම.

## අභ්‍යන්තර විගණන අංශය

<u>මුදල් අංශය</u>

1. 2014 වර්ෂයේ විගණන සැලසුම හා විගණන වැඩසටහන සකස් කිරීම
2. මුදල් සමීක්ෂණය
3. මුදල් පොත් පරීක්ෂාව
4. වේතන අතිකාල පරීක්ෂාව
5. වේතන/උත්සව අත්තිකාරම් පරීක්ෂාව
6. කොන්දොස්තර හිඟ මුදල් පරීක්ෂාව
7. පාරිතෝෂික ගෙවීම් පරීක්ෂාව
8. දෛනික එකතු කිරීමේ ලේඛන පරීක්ෂාව
9. දේශීය මිලදී ගැනීම් පරීක්ෂාව
10. අවසාන ගිණුම් විගණනය
11. ගිණුම් අංශයේ අනිකුත් ලේඛන පරීක්ෂාව

<u>තොග ගබඩාව</u>

1. වාර ප්‍රවේශ පත්‍ර ලේඛන පරීක්ෂාව
2. ගබඩා සමීක්ෂණය
3. ඉන්ධන පරිභෝජන පරීක්ෂාව
4. අමතර කොටස් පරිභෝජනය පරීක්ෂාව
5. ටයර් පරිභෝජනය පරීක්ෂාව
6. දුණු කොළ පරිභෝජනය පරීක්ෂාව
7. අපහරණ කටයුතු

<u>ධාවන අංශය</u>

1. මාර්ග ලේඛන පරීක්ෂාව
2. අනතුරු ලේඛන පරීක්ෂාව
3. කාර්ය චක්‍ර ලේඛන පරීක්ෂාව
4. ධා/51, ධා/50, ධා/40, ධා/41 ලේඛන පරීක්ෂාව

<u>ඉංජිනේරු අංශය</u>

1. ආපදා අළුත්වැඩියාව
2. අමතර කොටස් අධික පරිභෝජනය
3. අකාලයේ අසාර්ථක වන අමතර කොටස් පරීක්ෂාව
4. ඉංජිනේරු අංශයේ අනිකුත් ලේඛන පරීක්ෂාව

වෙනත්

1. විනය ලේඛන පරික්ෂාව
2. නිවාඩු ලේඛන පරික්ෂාව
3. මණ්ඩලීය වත්කම් පරික්ෂාව
4. රියදුරු අභ්‍යාස විද්‍යාල වල ආදායම්, වියදම්, නඩත්තු හා පාලන යන අංශ විගණනයට ලක් කිරීම
5. සංචාරක නිවාඩු නිකේතන පරික්ෂාව
6. ශාලිකා ශාලාව හා ක්‍රීඩාංගනය පරික්ෂාව
7. ප්‍රධාන කාර්යාලයේ පොදු කාර්ය වියදම් විශ්ලේෂණය (ජලය, දුරකථන, විදුලිය, ලිපිද්‍රව්‍ය)
8. රාජ්‍ය ප්‍රතිපත්ති හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති
9. ප්‍රාදේශීය අභ්‍යන්තර ගිණුම් පරීක්ෂකවරුන්ගේ මාසික සාකච්ඡා පැවැත්වීම
10. ත්‍රෛයිමාසිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම
11. සභාපතිතුමා විසින් යොමු කරන විශේෂ පරීක්ෂණ
12. ප්‍රාදේශීය ඒකක වල වාර්ෂික විගණන සාකච්ඡා පැවැත්වීම.

## ටෙන්ඩර් මණ්ඩලය

| අනු අංකය | ප්‍රසම්පාදන අංකය | සිදු කළ ක්‍රියාකාරකම් | වර්තමාන තත්වය හා ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | SLTB/TS/GEN/2014/01 | ශ්‍රී ලංගම වෙත අධි සුඛෝපභෝගී බස්රථ 15 ක් මිලදී ගැනීම | මිලදී ගෙන ඇත. |
| 02 | SLTB/TS/GEN/05/2014 | Quotation for new Identity Card Printer Machine For Operation Division – SLTB (FARGO HDP 8500) I වර | නැවත මිල ගණන් කැඳවන ලදී. |
| 03 | SLTB/TS/GEN/Civil/01/2014 | ශ්‍රී ලංගම තංගල්ල ඩිපෝව සිටි නාමළුව කාර්මික ජනපද භූමියේ අලුතින් ඉදිකිරීම - අදියර 1 | කාර්යය සිදුකර නොමැත. |
| 04 | SLTB/TS/GEN/05/2014 | ශ්‍රී ලංගම සියලුම ඩිපෝවන් සඳහා මුද්‍රිත පෝරම මුද්‍රණය කිරීම - 2014 වර්ෂය | මිල ගණන් අනුමත කර ඩිපෝ අවශ්‍යතාවයන් ලබාගැනීමට ඩිපෝ දැනුවත් කර ඇත. |
| 05 | SLTB/TS/GEN/07/2014 | ඔරුගොඩවත්ත ශ්‍රී ලංගම ඉන්ධන පිරවුම්හලට පෙට්‍රල් පොම්පයක් මිලදී ගැනීම | මිලදී ගෙන ඇත. |
| 06 | SLTB/TS/Civil/2014/02 | ආරක්ෂක අංශය හා විමර්ශන අංශය අතර ඇළුමිනියම් පාටිෂන් කිරීම සඳහා මිල ගණන් කැඳවීම. | අවසන් |
| 07 | SLTB/TS/GEN/2014/10/I | Quotation For Scanner Machine For Head Office | මිලදී ගෙන නොමැත. |
| 08 | SLTB/TS/GEN/38/2014/01 | ශ්‍රී ලංගම රුහුණු ප්‍රාදේශිකය සහ වයඹ ප්‍රාදේශිකය සඳහා කැබ් රථ 03 ක් මිලදී ගැනීම. | මිලදී ගෙන ඇත. |
| 09 | SLTB/TS/GEN/26/2014 | 32-2041 අංක දරණ ජීප් රථය සම්පූර්ණ බොඩි අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීම. | සම්පූර්ණ කර ඇත. |
| 10 | SLTB/TS/GEN/05/2014 | Quotation For New Identity Card Printer Machine For Operation Division – SLTB (FARGO HDP 8500) | අවසන් |
| 11 | SLTB/TS/GEN/10/2014 | Quotation for Multimedia Projector for Training Section – SLTB | අවසන් |
| 12 | SLTB/TS/GEN/10 | Quotation For the Construction of Fence | නැවත ටෙන්ඩර් |

| | | | |
|---|---|---|---|
| | /14/CIVIL/03 | Security Chanlink at Rathmalana Depot. | කැඳවන ලදී. |
| 13 | SLTB/TS/GEN/10 /14 | මොරටුව ආදර්ශ කොන්දොස්තර පුහුණු පාසලේ නේවාසිකාගාරය සඳහා වානේ කබඩ් මිලදී ගැනීම | අවසන් |
| 14 | SLTB/TS/GEN/10 /2014 | ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් කොට්ඨාශය සඳහා ප්ලාස්ටික් පුටු මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | අවසන් |
| 15 | SLTB/TS/GEN/19 II/2014 | Providing Date Stamps Designation Stamps For SLTB Head Office | අවශ්‍යතාවය මත |
| 16 | SLTB/TS/GEN/02 /2014 | මෝටර් රථ අමතර කොටස් සඳහා මිල ගණන් කැඳවීම. | වාර්ෂික අවශ්‍යතාවය මත. |
| 17 | SLTB/TS/GEN/19 I/2014 | Quotation For Toners, Cartridges & Ink Ribbons. | වාර්ෂික අවශ්‍යතාවය මත. |
| 18 | SLTB/TS/GEN/26 /2014/II | 50 ශ්‍රී 7925 දරණ මිට්සුබිෂි ඩෙලිකා එල් 300 වෑන් රථය සම්පූර්ණ බොඩි අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීම. | සම්පූර්ණ කර ඇත. |
| 19 | SLTB/TS/GEN/62 /2014 | ශ්‍රී ලංගම ඩිපෝවන්හි ඉන්ධන නිකුත් කිරීමේ පොම්ප සඳහා නව ඩිජිටල් මීටර් සවිකිරීම සඳහා මිල ගණන් කැඳවීම. | ලබාගෙන නොමැත. |
| 20 | SLTB/TS/Civil/20 14/16 IV | Quotation For Repairing Boundary Wall at Shalika Ground. | අවසන් (සිවිල් ඉංජිනේරු කොට්ඨාශය මගින්) |
| 21 | SLTB/TS/Civil/20 14/16 V | Quotation For Construction fo Boundary Wall(144'-0") at Management Training Center Katubedda. | අවසන් |
| 22 | SLTB/TS/Civil/20 14/16 VI | Demolishing & Removing Old Building Rathmalana Depot. | අවසන් |
| 23 | SLTB/TS/GEN/07 /2014/I | ශ්‍රී ලංගම වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම. | අවසන් |
| 24 | SLTB/TS/GEN/07 /2014/ II | ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | මිලදී ගෙන නැත. |
| 25 | SLTB/TS/GEN/07 /2014/ III | ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම් පොළට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | අනුමත මිල ගණන් යටතේ මිලදී ගැනීම සිදුකර ඇත. |
| 26 | SLTB/TS/GEN/39 /2014 | ශ්‍රී ලංගම රියදුරු අභ්‍යාස විද්‍යාල වලට ද්විත්ම කාර්ය නව වෑන් රථ 12ක් පහසු ගෙවීමේ පදනම මත ලබාගැනීම. | මිලදී ගෙන නොමැත |
| 27 | SLTB/TS/Civil/20 14/16 VII | Construction of New Partition Work In Account Office at Kesbewa Depot | ඩිපෝ මගින් අවසන් කර ඇත. |
| 28 | SLTB/TS/GEN/63 /2014 | යූ ටෝන් බස්රථ සඳහා බිමට අතුරන කාපට් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | මිල ගණන් අනුමත කර ඩිපෝ අවශ්‍යතාවය මත මිලදී ගැනීම සිදුකර ඇත. |
| 29 | SLTB/TS/Civil/20 14/16 VIII | Quotation For Repairing Toilet Block In D.T.S at Kalutara Depot | නැත |
| 30 | SLTB/TS/Civil/20 14/16 IX | Quotation For Construction of 20' – 0' wide Gate at Management Training Center Katubedda. | අවසන් |
| 31 | SLTB/TS/GEN/65 /2014 | C මාදිලියේ ආසන 36 දොර දෙකේ බස්රථ 02 ක් කල්බදු පදනම මත මිලදී ගැනීම. | මිලදී ගෙන ඇත |
| 32 | SLTB/TS/GEN/07 | Quotation For The Purchase of Photocopy | අවසන් |

| | | | |
|---|---|---|---|
| | /2014/IV | Machines For SLTB. | |
| 33 | SLTB/TS/GEN/28 /2014 | බැටරි 2000 ක් මිලදී ගැනිම සඳහා ලංසු කැඳවීම. | අවශ්‍යතාවය මත මිලදී ගෙන ඇත. |
| 34 | SLTB/TS/GEN/64 /2014 | ශ්‍රී ලංගම වෙත ආසන 20 -25 නව බස්රථ 05 ක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීම. | මිලදී ගෙන නැත. |
| 35 | SLTB/TS/GEN/26 III/2014 | Quotation For the Supply of I.D. Card Printing Materials For SLTB | අවසන් |
| 36 | SLTB/TS/GEN/05 iv/2014 | ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය වන ඉන්වොයිස් පත්‍ර (මු 139) මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවීම. | 200 ක ප්‍රමාණයක් පමණක් මුද්‍රණය කර ලබාගෙන ඇත. |
| 37 | SLTB/TS/GEN/66 /2014 | ශ්‍රී ලංගම වෙත ටයර් සැකිලි 5000 මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීම. | මිලදී ගෙන නැත. |
| 38 | SLTB/TS/GEN/26 /2014 | 252- 2847 අංක දරණ ටොයෝටා ටවුන් ඒස් වෑන් රථයේ සම්පූර්ණ බොඩි අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීම. | අවසන් කර ඇත. |
| 39 | SLTB/TS/GEN/05 v/14 | රියදුරු පුහුණුවෙන් පසු නිකුත් කරනු ලබන සහතික පත්‍ර ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | සැලසුම් කළ ප්‍රමාණයන් මිලදී ගෙන ඇත. |
| 40 | SLTB/TS/GEN/05 VI/2014 | ශ්‍රී ලංගම ලිපි ශීර්ෂ (Letter Heads) මුද්‍රණය කරවා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | දෙවන වර මිල ගණන් කැඳවා ඇත. |
| 41 | SLTB/TS/GEN/02 /2014/II | මෝටර් රථ අමතර කොටස් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | වාර්ෂික අවශ්‍යතාවය මත |
| 42 | SLTB/TS/GEN/36 /2014 | ශ්‍රී ලංගම ඩිපෝවන්හි භාවිතා කරන GPRS ටිකට් මැෂින් සඳහා අවශ්‍ය (තර්මල් කඩදාසි) ටිකට් රෝල් මිලදී ගැනීම. | වාර්ෂික අවශ්‍යතාවය මත |
| 43 | SLTB/TS/GEN/04 /2014 | ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය එනැමල් තීන්ත සහ අදාල උපාංග මිලදී ගැනීම | වාර්ෂික අවශ්‍යතාවය මත |
| 44 | SLTB/TS/GEN/07 V/14 | ඔරුගොඩවත්ත/ රත්මලාන ශ්‍රී ලංගම ඉන්ධන පිරවුම්හල් සඳහා අවශ්‍ය ඉන්ධන පොම්ප 02 ක් මිලදී ගැනීම | ලබාගෙන නොමැත. |
| 45 | SLTB/TS/GEN/05 VII/2014 | රියදුරු පුහුණුවෙන් පසු නිකුත් කරනු ලබන සහතික පත්‍ර ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම (දෙවැනි වර) | සැලසුම් කළ ප්‍රමාණය මිලදීගෙන ඇත. |
| 46 | SLTB/TS/GEN/67 I/2014 | ශ්‍රී ලංගම සඳහා අවශ්‍ය ආසන 33 – 37 බස්රථ 10 ක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීම. | මිලදීගෙන නැත |
| 47 | SLTB/TS/GEN/05 VIII/2014 | භාණ්ඩ ඇනවුම් කිරීම/ භාණ්ඩ නිකුත් කිරීම සහ භාණ්ඩ භාරගැනීමේ වවුචර් පත් සඳහා මිල ගණන් කැඳවීම. | සැලසුම් කළ ප්‍රමාණය මිලදී ගෙන ඇත |
| 48 | SLTB/TS/GEN/07 VI/2014 | ඔරුගොඩවත්ත/ රත්මලාන ශ්‍රී ලංගම ඉන්ධන පිරවුම්හල් සඳහා අවශ්‍ය ඉන්ධන පොම්ප මිලදීගැනීම. (දෙවැනි වර) | රත්මලානට පමණක් ලබාගෙන ඇත. |
| 49 | SLTB/TS/GEN/65 /2014 | අධිවේගී මාර්ගයේ ධාවනය වන බස්රථ වලට අවශ්‍ය ටයර් කිට්/ රේඩියල් ටයර් (Tubeless Tyre) සඳහා මිල ගණන් කැඳවීම. | ඉදිරි වැඩ කටයුතු සඳහා සම්පාදක අංශයට යොමු කර ඇත. |
| 50 | SLTB/TS/GEN/07 VII/2014 | Quotation For Plant & Machinery For SLTB Mallakam Depot | ඩිපෝ මගින් ලබාගැනීම සඳහා අනුමත මිල ගණන් ලබාදී ඇත. |
| 51 | SLTB/TS/GEN/67 /2014 | ආසන 50 – 20 කුඩා බස්රථ 05 ක් මිලදී ගැනීම. | නැත |
| 52 | SLTB/TS/GEN/69 | Quotation For Selecting of a Suitable Clearing | අවසන් |

| | | | |
|---|---|---|---|
| | /2014 | Agent For SLTB | |
| 53 | SLTB/TS/GEN/70 /2014 | ශ්‍රී ලංගම සඳහා අවශ්‍ය සින්ගල් කැබ් 50 ක් මිලදී ගැනීමේ ටෙන්ඩරය | තාවකාලිකව නවතා ඇත. |
| 54 | SLTB/TS/GEN/ආරක්ෂ.නි/2014 | ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක නියාමක මහතුන් හට නිල ඇඳුම් මැසීම (අවශ්‍ය රෙදි යොදා) සඳහා මිල ගණන් කැඳවීම. | අවසන් |
| 55 | SLTB/TS/GEN/05 III/2014 | Quotation for Supply of ID Card Printing Materials For SLTB | අවසන් |
| 56 | ශ්‍රීලංගම/ටෙම/රියදුරු.නි.ඇ/2014 | ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ නිල වාහන රියදුරු කාර්ය මණ්ඩලයට 2015 වර්ෂය සඳා නිල ඇඳුම් ලබාදීමට අවශ්‍ය රෙදි මිලදී ගැනීම හා මසා නිමකර ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | අවසන් |
| 57 | SLTB/TS/GEN/ 07 VIII /2014 | නව සුඛෝපභෝගී බස්රථ අලුත්වැඩියා කටයුතු කිරීම සඳහා අලුතින් ඉදිකරනු ලබන ගරාජයේ පරිහරණය සඳහා අවශ්‍ය නව යන්ත්‍රෝපකරණ ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | මිලදී ගැනීම් හා ගෙවීම් කටයුතු නව සුඛෝපභෝගී බස්රථ ප්‍රවාහන ඒකකය මගින් සිදුකර ඇත. |
| 58 | SLTB/TS/GEN/ 67 II /2014 | ආසන 15 – 20 කුඩා බස්රථ 05 ක් මිලදී ගැනීම (II වනවර) | |
| 59 | SLTB/TS/CB/33/2014 | ශ්‍රී ලංගම කතරගම සංචාරක නිවාසයට අවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | |
| 60 | SLTB/TS/GEN/65 /2014 | යූටෝන්ග් නව බස්ර සඳහා අවශ්‍ය ටයර් කිට් ලබා ගැනීම. ප්‍රදර්ශනය | |
| 61 | SLTB/TS/P.S/01/2014 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ආරක්ෂක සේවාවන් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | |
| 62 | SLTB/TS/GEN/68 /2014 | ශ්‍රී ලංගම බස්රථ ඇතුලත LED තිරයක්මගින්දැන්වීම්ප්‍රදර්ශනය කිරීමට සුදුසු ප්‍රචාරණ ආයතනයක් තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | |
| 63 | SLTB/TS/SUI/01/ 2014 | ශ්‍රී ලංගම කුරුණෑගල දකුණ, පානදුර, කටුබැද්ද, අළුත්ගම, මඩකලපුව, වාලච්චේන ඩිපෝවන් සහ අගුලාන රියදුරු අභ්‍යාස විද්‍යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද අබලි අමතර කොටස්. | |
| 64 | ශ්‍රීලංගම/ටෙම/පැරණි කඩදාසි/2014/01 | ප්‍රධාන කාර්යාලයේ ගොඩගැනී ඇති පැරණි කඩදාසි විකිණීම. | |
| 65 | SLTB/TS/SUI/02/ 2014 | ශ්‍රී ලංගම දැරණියගල, රඹුක්කන, මඩකලපුව, වාලච්චේන, අළුත්ගම, කරුණෑගල දකුණ, කටුබැද්ද සහ පානදුර ඩිපෝවන් හා මැදවච්චිය, පෙට්ටිගලවත්ත ප්‍රාදේශීය වැඩපල සහ අගුලාන රියදුරු අභ්‍යාස විද්‍යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද අබලි අමතර කොටස් විකිණීමේ ටෙන්ඩරය. | |
| 66 | SLTB/TS/GEN/2014/12III | ශ්‍රී ලංගම අම්පාර ටයර් කම්හලේ බෆින් කුඩු විකිණීම සඳහා මිල ගණන් කැඳවීම. | |
| 67 | SLTB/TS/සාමාන්‍ය /සුහසාධක | භාවිතයෙන් ඉවත් කර ඇති පරිගණක ආශ්‍රිත උපාංග ටෙන්ඩර් මගින් විකිණීම. | |
| 68 | ශ්‍රීලංගම/ටෙම/පැරණි පුවත්/2014/I | ප්‍රධාන කාර්යාලයේ ගොඩගැසී ඇති පැරණි පුවත් පත් විකිණීම. | |
| 69 | SLTB/TS/GEN/2014/12 IV | ශ්‍රී ලංගම අම්පාර ටයර් කම්හලේ බෆින් කුඩු (Baffin Powder) විකිණීමසඳහාමිලගණන්කැඳවීම. | |

## වාණිජ හා සම්පාදක කොට්ඨාශය

1. දිවයින පුරා ඇති සියලුම ප්‍රාදේශීය වැඩපලවල් වලට අවශ්‍ය අමතර කොටස් හා උපාංග මිලදී ගැනීම, පිළිවෙත් ප්‍රකාරව තොග ගත කිරීම, නිකුත් කිරීම, ලේඛනගත කිරීම සහ ඊට අදාල ගෙවීම් වවුචර් මූල්‍ය අංශය වෙත යොමු කිරීම. මීට අමතරව කාර්මික කොට්ඨාශයේ නිර්දේශය පරිදි දිවයින පුරා පිහිටි ඩිපෝ වලට අවශ්‍ය අමතර කොටස් මිලදී ගෙන ඉහත පරිදි නිකුත් කර ගෙවීම් කටයුතු සඳහා යොමු කිරීම.

2. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය සියලුම ලිපි ද්‍රව්‍ය ටෝනර් සහ පෙන් ඩ්‍රයිව්, ඝණක යන්ත්‍ර, වාර්ෂික අවශ්‍යතාව අනුව සියලුම කොට්ඨාශ හා අංශ වලින් ලැයිස් ලබාගෙන ඊට අදාල ටෙන්ඩර් මණ්ඩල වෙත ඉදිරිපත් කර ටෙන්ඩර් මිල කැඳවීම් කළ පසු එම මිල උප ලේඛනය කර ඇගයීම් කමිටු වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම කමිටු තීරණය මත මිල ගණන් හා සැපයුම්කරුවන් තෝරා අවශ්‍ය වාර්ෂික ලිපි ද්‍රව්‍ය ද්විමාසික අවශ්‍යතාවය මත ඇණවුම් කිරීම, බින්කාඩ් ගත කිරීම, ගෙවීම් හා පියවීම් කටයුතු කිරීම හා බෙදාහැරීම.

3. සියලුම කාර්යාල උපකරණ ( පරිගණක හා ඒ ආශ්‍රිත උපාංග, මුද්‍රණ යන්ත්‍ර, UPS යන්ත්‍ර, වායුසමීකරණ යන්ත්‍ර, ඇඟිලි සලකුණු යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර) හා කාර්යාලීය ගෘහ භාණ්ඩ අවශ්‍යතාවය පරිදි ටෙන්ඩර් මණ්ඩල මිල අනුමැතියෙන් පසුව මිලදී ගැනීම, ගෙවීම් පියවීම් කටයුතු කිරීම හා ටෙන්ඩර් මණ්ඩලය වෙත ලිඛිත ඉදිරිපත් කිරීම් කර ආවරණ ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබාගැනීම.

4. අවශ්‍යතාවය පරිදි ශ්‍රී ලංගම ඩිපෝවන් ප්‍රාදේශීය වැඩපල හා ප්‍රාදේශිකයන් සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ හා කාර්යාලීය ගෘහ භාණ්ඩ උපකරණ මිලදී ගැනීමට අනුමත මිල හා සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු දැන්වීම.

5. ශ්‍රී ලංගම සියළුම සංචාරක බංගලාවන් හා නිවාඩු නිකේතන සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ, මුළුතැන්ගෙය උපකරණ, විදුලි උපකරණ, ටෙන්ඩර් අනුමත මිල අනුව මිලදී ගැනීම්, සැපයීම්, ගෙවීම් හා පියවීම් කටයුතු කිරීම හා ඉන්වෙන්ටරි ගත කිරීම.

6. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයට හා ප්‍රධාන කාර්යාලය යටතේ මූල්‍ය ප්‍රතිපාදන ක්‍රියාත්මක වන සේවා ස්ථාන සඳහා අවශ්‍ය විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීම, වායුසමීකරණ නඩත්තු, අලුත්වැඩියා සඳහා උපාංග, විදුලි උපාංග සහ අමුද්‍රව්‍ය ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය යටතේ මිලදී ගැනීම, සැපයීම, ගෙවීම, පියවීම් කටයුතු කිරීම.

7. ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය නව ටයර් කිට් සහ බැටරි මිලදීගෙන අවශ්‍යතාවයන් පරිදි ප්‍රාදේශීය කාර්යාල හරහා දිවයිනේ සියලුම ඩිපෝවලට බෙදා හැරීම සහ ඊට අදාල ලේඛන නිසි පරිදි නඩත්තු කිරීම, තොග පාලන කටයුතු කිරීම සහ ගෙවීම් කටයුතු සඳහා යොමු කිරීම.

8. වාර්ෂිකව ශ්‍රී ලංගම වෙත අවශ්‍ය වාර ප්‍රවේශපත්‍ර මුද්‍රණය කර තොග පවත්වාගෙන යෑම, අවශ්‍යතාවය පරිදි සියලුම ඩිපෝ වලට නිකුත් කිරීම, ඊට අදාල ලේඛන පවත්වාගෙන යාම සහ ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය වවුචර් පත්‍ර පිළියෙල කිරීම.

9. ශ්‍රී ලංගම සේවකයින් සහ බාහිර පුද්ගලයින් වෙත නිකුත් කරනු ලබන ගමන් බලපත්‍ර මුද්‍රණය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන නිකුත් කිරීම, ඊට අදාල ලේඛන පවත්වාගෙන යාම සහ ගෙවීම් කටයුතු සඳහා යොමු කිරීම.

10. යූටෝන්ග් බස්රථ සඳහා අවශ්‍ය අමතර කොටස් හා උපාංග චීනයේ සැපයුම්කරුවන් වෙතින් මිලදී ගෙන, ශ්‍රී ලංකා රේගුව වෙතින් අදාල භාණ්ඩ නිෂ්කාශනය කරවාගෙන අවශ්‍යතාවය පරිදි නිකුත් කිරීම, තොග ලේඛන පවත්වාගෙන යාම සහ ඊට අදාල ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය ලේඛන සැකසීම.

11. ශ්‍රී ලංගම යටතේ ඇති සංචාරක සහ නිවාඩු නිකේතන සඳහා අවශ්‍ය සියලුම ද්‍රව්‍ය සහ භාණ්ඩ මිලදීගෙන සැපයීම සහ ඊට අදාල ලේඛන සහ ලිපිගොනු නඩත්තු කිරීම.

12. දිවයින පුරා ඇති රියදුරු අභ්‍යාස විද්‍යාල වලට අවශ්‍ය වාහන සහ අනෙකුත් භාණ්ඩ අවශ්‍යතාවයන් පරිදි මිලදී ගෙන ලබාදීම සහ ඊට අදාල ගබඩා ලේඛනයක් පවත්වාගෙන යාම.

13. වාහන මිලදී ගැනීම (නිල වාහන සඳහා) සඳහා වවුචර් පත් පිළියෙල කිරීම, ඊට අදාල ලේඛන සහ ලිපිගොනු නඩත්තු කිරීම.

14. කඩිනම් අවශ්‍යතා සඳහා ටෙන්ඩර් මණ්ඩල අනුමත මිල ගණන් නොමැති අවස්ථාවලමිල කැඳවීම් කිරීම, උප ලේඛන සෑදීම, ආවරණ ටෙන්ඩර් අනුමැතිය ලබා ගැනීම.

15. ඉහත සියලුම මිලදී ගැනීම්කොටස් අංකයටතේ (W-Wise) වෙන්වෙන්ව විෂයන්ලෙසබෙදාවෙන්කරසේවකම ණ්ඩලයවෙතපවරාරාජකාරිඉ ටුකිරීම.

16. මිලදී ගන්නා සහ සැපයුම්කරන සියළුම විෂයන් බින් කාඩ් ගත කිරීමෙන් විධිමත් ලෙස තොග පාලන කටයුතු කිරීම.

17. ඇණවුම්, නිකුත් කිරීම් වවුචර් (S-1), ලැබීම් වවුචර් පිළියෙල කිරීම (S –5 – RV) සහ නිකුත් කිරීමේ වවුචර් (S-6 – IV) ලේඛන නියමිත පරිදි පරිගණක ගත කිරීමට කටයුතු කිරීම.

18. සියළුම මිලදී ගැනීම් වලට අදාල ලියාපදිංචි මිල කැඳවීම් මගින් ටෙන්ඩර් කැඳවා ඇති අවස්ථාවන් වලදී ඒවා විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර් විවෘත කිරීම, ටෙන්ඩර් විවෘත කිරීමේ කමිටු නිලධාරියෙකු ලෙස සහභාගි වීම, සියළුම මිල ගණන් උපලේඛනය කිරීම, මිල අනුමැතිය ලබා ගැනීම සඳහා ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

19. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සටහන් කර, විගණන හා කළමනාකරණ කමිටුව වෙත සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනුමැතිය සඳහා යොමු කිරීම සහ ඉන්පසු වාර්ෂිකව අදාල ප්‍රගතිය පිළිබඳ වාර්තා පිළියෙල කිරීම.

20. ප්‍රධාන ගබඩාවේ දෛනික කටයුතු අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය උපදෙස් සහ ගබඩාකරණය, පිළිවෙත් හඳුන්වා දීම, ඒ අනුව කටයුතු කිරීම.

21. ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර සහ අනෙකුත් ලද උපකරණ අලුත්වැඩියා කළයුතු අවස්ථා වලදී අලුත්වැඩියාවන් සඳහා යොමු කිරීමට කටයුතු කිරීම සහ නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීම.

22. සියලුම ටෙන්ඩර් කටයුතු කළ පසු එම කටයුතු සඳහා උපලේඛන සැකසීම, ලිපි සැකසීම, ඇගයීම් කමිටු සඳහා ඉදිරිපත් කිරීම, ඇගයීම් වාර්තා සැකසීම.

23. අබලි බස්රථ, ටයර් පැරණි පුවත්පත් ටෙන්ඩර්, අනුමත මිල අනුව විකිණීම සහ අදාල මිල ගණන් ලැයිස්තුගත කිරීම සහ අදාල ලේඛන පිළියෙල කිරීම.

24. සියලුම මිලදී ගැනීම් වල බිල්පත් අවසාන ගිණුම් ගෙවීම් සඳහා යොමු කිරීම. ලේඛනගත කිරීම.

25. ශ්‍රී ලංගමට අයත් ප්‍රාදේශීය වැඩපලවල්, ඩිපෝ, ප්‍රාදේශීය කාර්යාල වල සම්පාදක නිලධාරී, සම්පාදක සහයක, ගබඩා පාලකවරුන් පිළිබඳ විස්තර පවත්වාගෙන යාම සහ පත් කිරීමට අදාල සම්මුඛ පරීක්ෂන වලට සහභාගි වීම සහ පත්කිරීමට සහ ස්ථාන මාරු වලට අදාල නිර්දේශ සහ අනෙකුත් සහ අධීක්ෂණ කටයුතු කිරීම.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සීටීබී/ඒ/එස්එල්ටීබී/<br>එෆ්ඒ/01/2014/ 24 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2018 ජනවාරි 29 දින |

සභාපති,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම්කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අභිමතාර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලය දිගින් දිගටම අලාභ ලැබීම මත ශුද්ධ වත්කම් විශාල ලෙස බාදනයට ලක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ශුද්ධ වත්කම් රු. 28,147,592,104 ක සෘණ අගයක් ගෙන තිබූ අතර ඒ හේතුවෙන් භාණ්ඩාගාරයේ හෝ රජයේ මූල්‍ය සහායක් නොමැතිව ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් ඇති වෙමින් තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය තත්ත්වය විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ජංගම වගකීම් ආවරණය කරගැනීම සඳහා ඇති ජංගම වත්කම් ප්‍රමාණය මුළු ජංගම වගකීම්වලින් සියයට 34 ක පහළ මට්ටමක පැවති අතර 2010 වර්ෂයේදී මෙම මට්ටම සියයට 42 ක් ලෙස පැවතුණි. ගෙවිය යුතු මුදල් නියමිත පරිදි නොගෙවීම, අය කරගත යුතු මුදල් අය කරගැනීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලීනව නිරවුල් නොවී ඉදිරියට එමින් පවතින ශේෂ මෙම තත්ත්වය ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස දැක්විය යුතු රු. 741,501,613 ක් වූ රජයේ ප්‍රදාන ලැබීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතය ප්‍රකාර වත්කම් ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට ඵලදායී ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කළ යුතු නමුත් මණ්ඩලය, වත්කම් මිලදී ගත් වර්ෂය සඳහා ක්ෂය නොකිරීමේ හා ඉවත් කරන වර්ෂය වෙනුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන ප්‍රයෝජනයට ගෙන තිබූ රු. 1,402,746,999 ක දේපළ, පිරියත හා උපකරණ වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) 2005 වර්ෂයට පසුව මිලදීගෙන ඇති නමුත් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ බස්රථ 2,235 ක් සහ ඊට පෙර මිලදීගෙන තවදුරටත් ධාවන තත්ත්වයේ පැවති බස්රථ නැවත තක්සේරු කර ගිණුම්වල දැක්වීමට පියවර ගෙන නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ඉඩම් හා ගොඩනැගිලිවල අගය වෙන් වශයෙන් හඳුනාගෙන නොතිබූ අතර ප්‍රමිතයට පටහැනි ලෙස ඉඩම් හා ගොඩනැගිලිවල මුළු අගය වූ රු.319,799,319 න් සියයට 50 ක් වන රු.159,899,660 ක් ගොඩනැගිලි ලෙස සලකා ඉන් සියයට 2.5 ක් ක්ෂය කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කල්බදු වත්කම්වල සාධාරණ අගය හෝ ගෙවීමට ඇති කල්බදු වාරිකවල වර්තමාන අගය යන දෙකින් අඩු අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද, මණ්ඩලය විසින් කල්බදු වගකීම පිරිවැය මතද, පොලී ප්‍රමාණය වාරික ගණනේ එකතු ක්‍රමය (Sum of digit method) මතද ගණනය කර රු. 10,064,442,013 ක් කල්බදු වගකීම යටතේ දක්වා තිබුණි.

(ii) කල්බදු සම්බන්ධයෙන් පහත සඳහන් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

- කාලපරිච්ඡේදය අවසානයට අවම කල්බදු වාරිකය හා එහි වර්තමාන අගය සැසඳීම.
- වසරකට නොඅඩු කාලයකට, වසරකට වැඩි, වසර 05 කට අඩු සහ වසර 05 කට වැඩි කාලපරිච්ඡේදයන්ට අදාළව වර්ගීකරණය කර ගිණුම් කාලපරිච්ඡේදය

අවසානයට වූ අනාගත කල්බදු වාරිකවල එකතුව හා ඒවායේ වර්තමාන අගයේ එකතුව.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

ප්‍රමිතිය ප්‍රකාරව පශ්චාත් සේවක ප්‍රතිලාභ වගකීම් මැනීම සම්බන්ධයෙන් ආයතනය විසින් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදාගෙන නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂයේදී රු.9,923,554,194 ක් වැයකර තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.9,921,453,594 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.2,100,600 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන ගැලපීම්වල අනෙකුත් ගෙවිය යුතු ගිණුම් යටතේ රු.11,193,911,852 ක් දක්වා තිබුණද, ලෙජර් ගිණුම් අනුව එම වටිනාකම රු.11,195,752,191 ක් වූයෙන් රු.1,840,339 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මණ්ඩලයේ බැංකු ගිණුම්හි 2012 වර්ෂයේ සිට 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා බැංකුව අයකළ එකතුව රු. 184,262 ක් වූ බැංකු ගාස්තු හා චෙක්පොත් ගාස්තු අදාළ මුදල් පොතට සහ වියදම් ගිණුම්වලට ගිණුම්ගතකර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට පෙන්නුම් කර තිබූ සමුච්චිත ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල 9 ක තොග සමීක්ෂණ වාර්තාවලට අනුව ගණනය කල තොග අගය ලෙජරයේ තොග අගයට වඩා රු. 80,122,221 කින් වැඩි වූ අතර ඊට හේතු සොයා බැලීමකින් තොරව මෙහෙයුම් ලාභයට ගැලපීම නිසා සමාලෝචිත වර්ෂයේ අලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල දැක්වෙන රු.2,468,853,247 ක වෙළඳ ණයගිමියන්ගේ ශේෂයෙන් එකතුව රු. 37,117,112 ක් වූ වෙළඳ ණයහිමි හර ශේෂ 03 ක් අඩුකර දක්වා තිබීමෙන් ණයහිමි ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ට) 2005 – 2012 කාලපරිච්ඡේදයට විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු විගණන ගාස්තුව රු. 3,081,446 ක් වුවත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල රු. 417,526 ක් ලෙස දක්වා තිබීමෙන් ගෙවිය යුතු විගණන ගාස්තු රු. 2,663,920 ක් අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඨ) නුවර සහ උතුරු ප්‍රාදේශිකයට අයත් උඩුදුම්බර සහ පේදුරුතුඩුව ඩිපෝ වෙතින් අයවිය යුතු පොලිස් බලපත්‍ර ආදායම් වූ රු. 3,653,998 ක් අයවිය යුතු ආදායම් ගිණුම් හර කිරීම වෙනුවට අදාළ පොලිස් බලපත්‍ර ආදායම් ගිණුමටම හරව සහ බැරව වැරදි ලෙස ගිණුම්ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා වෙළඳ ලැබීම් ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

(ඩ) සමාගම් 02 ක් වෙතින් 2014 වර්ෂයේදී මිලදීගෙන ගබඩාවට ලැබී තිබුණු රු. 13,824,553 ක බත්ර්ට අමතර කොටස් වට්නාකම්වල එකතුව සඳහා සියවිශම සටහන් අදාළ අත්තිකාරම් ගිණුමට හා ණයහිමි ගිණුමට ගිණුම්ගත නොකිරීමෙන් අත්තිකාරම් ගිණුමේ හා ණයහිමි ගිණුමේ ශේෂය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඪ) මණ්ඩලයේ බැංකු ගිණුම්කට අදාළව බැංකුව විසින් 1991 දෙසැම්බර් 12 හා 1992 සැප්තැම්බර් 01 දිනයන්හිදී පිළිවෙලින් හර කර තිබූ රු.70,449 ක් හා රු.2,100 ක් සහ 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මණ්ඩලයේ උතුරු ප්‍රාදේශිකයේ බැංකු ගිණුම් 4 ක් සඳහා ලැබී තිබුණු රු.12,665,851 ක් කුමන කරුණක් සඳහා ලැබුණේද යන්න හඳුනා ගෙන ගිණුම්ගත කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු සැසඳුම් ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ණ) මූල්‍ය ප්‍රකාශන අනුව ක්‍රියාකාරී නොවන ගිණුම් ලෙස එකතුව වූ රු. 9,935,375,095 ක හර ශේෂ හා රු. 26,054,948,782 ක බැර ශේෂ පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම ශේෂයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම් යටතේ දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි තත්ත්වයක් නිරූපණය නොවිය.

## 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය විසින් අමතර කොටස් මිලදී ගැණුම් බැංකු ගිණුම් 08 කින් සිදුකර තිබූ අතර ඉන් බැංකු ගිණුම් 02 කින් 2014 දෙසැම්බර් 31 දිනට ලබා දී තිබූ අත්තිකාරම් ශේෂය රු. 284,394,842 ක් වුවත් ඒ සඳහා ඉදිරිපත් කර තිබූ උපලේඛනයට අනුව එය රු. 290,959,007 ක් වූයෙන් රු.6,564,165 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලයේ අවසන් ගිණුම්වල දැක්වෙන ප්‍රාදේශිකයන් 04 ක ණය හිමි ශේෂය වූ රු.760,116,593 ක් සඳහා ඉදිරිපත්කර තිබූ ණයහිමි උපලේඛනයේ අගය රු.652,868,944 ක් වූයෙන් රු.107,247,649 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ගිණුම් අංශයේ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ නිකුත් කර තිබූ ගමන් බලපත්‍ර සංඛ්‍යාව 8,418 ක් වුවත් ධාවන අංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව නිකුත් කර තිබූ ගමන් බලපත්‍ර සංඛ්‍යාව 5,748 ක් වූයෙන් ගමන් බලපත්‍ර 3,270 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) සබරගමුව හා කළුතර ප්‍රාදේශිකයන් 02 හි ණයහිමියන් සඳහා නිකුත්කර තිබූ චෙක්පත් අවලංගු කිරීමේදී එම ණයහිමි ගිණුම්වල බැර ශේෂ ඇතිවිය යුතු වුවත් එම ගිණුම්වල පිළිවෙළින් රු.727,000 හා රු. 312,460 ක හර ශේෂ ඇති වී තිබූ අතර ඊට හේතු හෝ පැහැදිලි කිරීම් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.5 අවිනිශ්චිත ගිණුම්

වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට ශේෂය වෙනස් වෙමින් ඉදිරියට ගෙන එමින් තිබූ අවිනිශ්චිත ගිණුමක ඉකුත් වර්ෂයේ පැවති රු. 17,664,474 ක් වූ හර ශේෂය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.129,933,148 ක හර ශේෂයක් දක්වා වැඩිවී තිබුණි. මණ්ඩලයේ උතුරු හා ඌව පළාතේ ඩිපෝ 9ක මිලදී ගැනීම් වලට අදාලව නොග ගිණුම්ගත කිරීමේ දෝෂ හේතුවෙන් අවිනිශ්චිත ගිණුමේ ශේෂය වැඩි වී තිබුණද ඊට අදාළ ගැලපීම් කර නොතිබුණි.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | වෙළඳ ණයහිමියෝ | 1,815,984,303 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (ආ) | මිලදී ගැනුම් අත්තිකාරම් | 795,139,018 | ජර්නල් සටහන් 14 ට අදාළ පියවීම් පිළිබඳ විස්තර |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කොන්දොස්තර හිඟ ආදායම් | 14,414,671 | ප්‍රාදේශිකයන් 11 කට අදාළ උපලේඛන |
| (ඈ) | කැෂියර් හිඟ ශේෂය | 36,251,543 | උපලේඛන |
| (ඉ) | වෙළඳ ණයගැති ශේෂය | 12,782,295 | උපලේඛන |
| (ඊ) | අවලංගු කළ චෙක්පත් | 11,988,614 | විස්තරාත්මක උපලේඛනය |
| (උ) | අත්තිකාරම් | 34,000,000 | අත්තිකාරම් පියවීමට අදාළ ලියවිලි |
| (ඌ) | මිලදී ගැනීම් අත්තිකාරම් | 3,000,000 | ගෙවීම් වවුචර් |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කර තිබූ හිඟ අත්තිකාරම් පිළිබඳ විස්තරාත්මක උපලේඛනයට අනුව 2014 වර්ෂයට පෙර ලබා දුන් ගැනුම් අත්තිකාරම්වලින් රු.764,374,902 ක් හෙවත් සියයට 42 ක් වසරක් ඉක්මවා තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සේවක අර්ථසාධක අරමුදල් වශයෙන් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලීය අරමුදලට, ශ්‍රී ලංකා මහ බැංකුවට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවිය යුතු එකතුව රු.5,927,694,884 ක් බේරුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙළඳ ණයහිමි උපලේඛන ඉදිරිපත් කර තිබූ ප්‍රාදේශීක 4 ක වයස් විශ්ලේෂණ අනුව වසර 1 ත් වසර 5 ත් අතර එකතුව රු.323,650,997 ක ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබූ අතර වසර 5 ත් වසර 10 ත් සහ වසර 10 කට වැඩි කාලයක් තුළ නිරවුල් කර නොතිබූ ණයහිමි ශේෂයන්ගේ වටිනාකම පිළිවෙලින් රු.48,969,260 ක් සහ රු.8,701,925 ක් විය.

(ඈ) කොළඹ ප්‍රාදේශීකයට අයත් අවිස්සාවේල්ල ඩිපෝවෙහි 2011 වර්ෂයේ සිට පැවත එන රු.636,536 ක අවලංගු කළ චෙක්පත් ශේෂයක් පවතින අතර ඊට හේතු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

(ඉ) කල්බදු පහසුකම් යටතේ 2014 ජූලි 01 සිට 2015 පෙබරවාරි 22 දින දක්වා ඩිපෝ 112 ක් වෙත ලබාදුන් බස්රථ 2,200 ක් සඳහා දිනකට රු.3,000 බැගින් මහජන බැංකුවේ බැංකු ගිණුමට තැන්පත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 82,672,002 ක් එම ඩිපෝ වෙතින් ප්‍රධාන කාර්යාලයට ලැබිය යුතුව තිබුණි.

(ඊ) නුවරඑළිය ප්‍රාදේශීකයට අයත් ගම්පොළ ඩිපෝවෙහි කොන්දොස්තර හිඟ මුදල් ශේෂය රු.412,968 ක් වූ අතර එම වටිනාකම තුළ රු.143,936 ක් වර්ෂයට වඩා වැඩි කාලයක් සිට හිඟව පැවතුණිද එම ශේෂ අයකර ගැනීමට අවධානය යොමු වී නොතිබුණි.

(උ) 2014 මැයි මාසයේ සිට 2015 නොවැම්බර් 10 දින දක්වා අනතුරු 47 ක් වෙනුවෙන් රු.6,470,187 ක මුදලක් රක්ෂණ වන්දි ලෙස ඉල්ලා තිබුණද එක් බස්රථයක් සඳහා ඉල්ලුම් කරන ලද රු.200,000 ක මුදල වෙනුවෙන් පමණක් රු.197,500 ක් ලැබී තිබූ අතර ඉතිරි මුදල් 2016 ජූලි 26 දින දක්වා අයවී නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා අනෙකුත් තැන්පත්වල පිළිවෙලින් රු. 421,948,344 ක්,රු. 7,749,998 ක් සහ රු. 42,323 ක් ආයෝජනය කර තිබුණද ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| I. මුදල් රෙගුලාසි 395 (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළව මණ්ඩලය මගින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 241 න් බැංකු ජංගම ගිණුම් 165 කට අදාලව බැංකු සැසඳුම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| II. මුදල් රෙගුලාසි 396 (ඇ) | බැංකු ගිණුම් 11 කට අදාළ නිකුත් කළ නමුත් මාස 06 ක් ඉකුත් වූ බැංකුවට ඉදිරිපත් නොකළ එකතුව රු. 9,179,895 ක් වූ චෙක්පත් 67 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| III. මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ගිණුම් 05ක එකතුව රු.20,927,743 ක් සඳහා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්වල විස්තර හා බැංකු ගිණුම් 02 ක එකතුව රු. 1,125,000 ක් සඳහා තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. |
| IV.මුදල් රෙගුලාසි 395 (ඌ) | නිලධාරීන්ට රාජකාරි පැවරීමේදී මුදල් පොත පිළියෙල කිරීමට සම්බන්ධ නොවූ නිලධාරියෙකුට බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ කාර්යය පැවරිය යුතු වුවත් මණ්ඩලයේ සියලුම බැංකු ගිණුම්වලට අදාල බැංකු සැසඳුම් පිළියෙළ කිරීමේ කාර්යය මුදල් පොත පවත්වාගෙන යනු ලබන නිලධාරීන් වෙත පවරා තිබුණි. |
| V. මුදල් රෙගුලාසි 446 (2) | බැංකු ජංගම ගිණුම් 02 ක් සඳහා පවත්වාගෙන තිබුණු මුදල් පොත් 2ට අදාලව එකතුව රු.84,508,230 ක ගෙවීම් වවුචර් අංක කර නොතිබුණු අතර මුදල් පොත වගකිව යුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක් කර නොතිබුණි. |
| VI. මුදල් රෙගුලාසි 757 හා 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 1,228,021,529 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,974,484,387 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.746,462,858 කින් අඩු වී තිබුණි. මණ්ඩලයේ මෙහෙයුම් වියදම් රු.1,977,695,268 කින් වැඩි වී තිබුණ ද මගී ප්‍රවාහන ආදායම් සහ අනෙකුත් ආදායම් රු. 2,804,917,880 කින් වැඩිවීම ඉහත පිරිහීම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා මණ්ඩලයේ ඌනතාවය ක්‍රමයෙන් වැඩි වී තිබුණු අතර 2013 හා 2014 වර්ෂවල ඌනතාවය ක්‍රමයෙන් අඩු වී තිබුණි. සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු මණ්ඩලයේ දායකත්වය 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේදී වර්ධනය වී තිබූ අතර 2012 වර්ෂයේ දී රු. 11,499,778,412 ක් වූ දායකත්වය 2014 වර්ෂයේ දී රු. 14,711,117,533 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 මණ්ඩලයට එරෙහිව හෝ මණ්ඩලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ප්‍රාදේශිකයන් 10 කට අදාළව බාහිර පාර්ශ්වයන් 31 දෙනෙකු විසින් ආයතනයට එරෙහිව රු. 87,372,874 ක වන්දියක් ඉල්ලා නඩු 31 ක් පවරා තිබුණි.

(ආ) ආයතනයේ සේවකයින් 10 දෙනෙකු විසින් ආයතනයට එරෙහිව නඩු 10 ක් පවරා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම නඩුවලින් 08 ක්ම සේවකයන්ට පක්ෂව විසඳී තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් බාහිර පාර්ශ්වයන් 07 දෙනෙකු වෙත රු. 9, 313,980 ක් වන්දි ඉල්ලා නඩු 07 ක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන පනතට අනුව මණ්ඩලයේ අරමුණු පහත දැක්වේ.

- ජාතික ගමනාගමන කොමිෂන් සභාව සහ අදාළ පළාත් ප්‍රවාහන අධිකාරී විසින් ආර්ථික ස්ථාවරත්වය ඇතිකරමින් කාර්යක්ෂම සහ ඵලදායී විධිමත් බස් සේවාවක් සැපයීම. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලයේ යෝජනා ඇතුළත් කරමින් සහ ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු ආකාරය හඳුනා ගනිමින් සැලැස්මට අදාල වාර්ෂික අයවැයක්ද පිළියෙළ කිරීම.

- මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රබලත්වය උපරිමයක් වන බවට සහතික වීම සඳහා එම මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යායුතු ආකාරයට මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම.

- පොදු ප්‍රවාහන සේවයේ ගුණාත්මක භාවය වැඩි දියුණු වන ආකාරයට ප්‍රවාහන ක්ෂේත්‍රයේ වෙනත් යෝජනා ක්‍රම හෝ සේවා ක්‍රියාත්මක කිරීම.

2014 වර්ෂයේ මණ්ඩලයේ අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් සංයුක්ත සැලැස්මට අනුව සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව සහ අයවැය ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත අනුව මණ්ඩලයේ බලතල අනුව ක්‍රියාත්මක කළ හැකි පහත දැක්වෙන කාර්යයන් සංයුක්ත සැලැස්ම සැකසීමේ දී අවධානය යොමු කර නොතිබුණි.

- මාර්ගස්ථ මගීන් සඳහා බස් නැවතුම්පලවල් හෝ ආවරණ සැපයීම.
- ප්‍රායෝගික නොවන හෝ දුෂ්කර බවට මණ්ඩලය විසින් සලකනු ලබන මාර්ගවල ප්‍රමාණවත් බස් සේවා සැපයීමට උත්සාහ කිරීම.
- මණ්ඩලයට අයත් බස් රථ නවත්වන ස්ථාන සපයාදීම සහ නඩත්තු කිරීම.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෛනික කාලසටහන් අවශ්‍යතාවයට අනුව බස් රථ 7,204 ක් ධාවනය කිරීම අවශ්‍ය වේ. 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව දෛනිකව බස් රථ 5500 ක් ධාවනය කිරීමට ඉලක්ක කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දිනකට ධාවනය කරන ලද බස් රථ සංඛ්‍යාව 4,596 ක් වී තිබුණි. ඒ අනුව මණ්ඩලයේ දෛනිකව ධාවනය කිරීමට අවශ්‍ය බස් රථ

සංඛ්‍යාවෙන් සියයට 36 ක් ධාවනය කිරීමට නොහැකිව තිබූ අතර 2014 ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 16 ක් ධාවනය කිරීමට නොහැකි වී තිබුණි.

සැලසුම් හා පර්යේෂණ අංශය හා ඉංජිනේරු අංශය විසින් ලබාදුන් තොරතුරු අනුව පසුගිය වර්ෂ 03 ක මණ්ඩලයේ බස් රථ ධාවනයේ ප්‍රගතිය අනුව මණ්ඩලයේ කාල සටහන් අවශ්‍යතාවයෙන් ධාවනය කළ බස් රථ සංඛ්‍යාව 2011 වර්ෂයේදී සියයට 60 ක්ව පැවතුණද එය 2013 වර්ෂය වන විට ක්‍රමයෙන් සියයට 67 ක් දක්වා වර්ධනය වී පැවත 2014 වර්ෂයේදී සියයට 64 දක්වා අඩුවී තිබුණි. එමෙන්ම මණ්ඩලය විසින් වාර්ෂිකව ධාවනය කිරීමට අපේක්ෂිත කිලෝ මීටර් ප්‍රමාණයෙන් 2011 වර්ෂයේදී සියයට 56 ක් ධාවනය කර තිබූ අතර 2014 වර්ෂය වන විට එය සියයට 60 ක් දක්වා වර්ධනය වී තිබුණද අපේක්ෂිත කිලෝ මීටර් ප්‍රමාණය සියයට 40 ක් පවදුරටත් ධාවනය කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) ධාවනය කළ හැකි තත්ත්වයේ තිබූ බස් රථ යොදාගෙන සමාලෝචිත වර්ෂය තුළදී කිලෝමීටර් 616,849,447 ක් ධාවනය කිරීමට සැලසුම්කර තිබුණද රියදුරු කොන්දොස්තර ප්‍රරප්පාඩු හා කාර්මික හේතු මත ධාවනය කර තිබුණේ කිලෝමීටර් 371,236,274 ක් පමණි. එනම් අපේක්ෂිත ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 60 ක් පමණක් ඉටු කර ගත හැකි වී තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් මාසයේ බස්රථ ඇණි තත්ත්ව වාර්තාව අනුව මණ්ඩලය සතු මුළු බස්රථ ඇණිය 7,669 න් බස්රථ 1,770 ක් ධාවනය නොවන බස්රථ විය. එමෙන්ම මෙම බස්රථ 1,770 න් 738 ක් අවුරුදු 15 ට වඩා පැරණි බස්රථ බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල වාර්තා අනුව රියදුරන් සංඛ්‍යාව 10,221 සහ කොන්දොස්තරවරු සංඛ්‍යාව 10,272 ක් වන අතර මුළු බස්රථ ඇණිය අඛණ්ඩව ධාවනයට එක් කිරීම සඳහා රියදුරන් සහ කොන්දොස්තරවරු නිසි කළමනාකරණයකින් යොදාගෙන නොතිබුණි. මණ්ඩලයේ මෙම තත්ත්වය ආදායම අඩු වීමට මෙන්ම කාර්යක්ෂම හා විධිමත් බස් සේවාවක් සැපයීමට බාධාවක් වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අනුව දෛනික මාර්ග ලේඛන ආදායම ලෙස රු. මිලියන 83 ක් ලබාගැනීමට ඉලක්ක කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෛනික මාර්ග ලේඛන ආදායම රු. මිලියන 60 ක් විය. ඒ අනුව සියයට 28 ක අපේක්ෂිත ඉලක්කයක් ලඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශිකවල බස් රථ ඇණියේ තත්ත්ව වාර්තා අනුව ප්‍රාදේශික 12 න් ප්‍රාදේශික 7 කට ධාවනයට ලබාදෙන ලද ඉලක්කය ලඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. බස් රථ සඳහා අවශ්‍ය නඩත්තු උපාංග හා අමතර කොටස් නොතිබීමත්,බස් රථ සැලකියයුතු සංඛ්‍යාවක් දෛනිකව අලුත්වැඩියාව සඳහා පැවතීම මෙන්ම ආර්ථික වාසි

නොමැතිවීම නිසා බස් රථ අලුත්වැඩියා නොකිරීම යනාදී කරුණු මත සැලකිය යුතු බස් රථ සංඛ්‍යාවක් ධාවනයෙන් ඉවත්වීම මෙම ඉලක්ක සපුරාගත නොහැකිවීමට හේතුවී තිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව 2014 වර්ෂයේ අපේක්ෂිත මාර්ග ලේඛන ආදායම කිලෝමීටරයකට රු. 65.21 ක් අපේක්ෂා කළ ද ධා - 51 වාර්තාව අනුව 2014 වර්ෂයේ කිලෝමීටරයකට ආදායම රු. 59.69 ක් වී තිබුණි. මේ අනුව කිලෝමීටරයකට රු. 5.52 ක ආදායම් ඉලක්කයක් ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඪ) පුහුණු පර්යේෂණ හා සංවර්ධන අංශයේ 2014 වර්ෂයේ වාර්තා අනුව වාර්ෂික පුහුණු ඉලක්කයන් හා සත්‍ය අගයන් අතර වෙනස්කම් පැවති අතර ඒ අනුව අපේක්ෂිත ඉලක්ක සපුරාගත නොහැකි වීම සියයට 18 සිට සියයට 60 දක්වා වූ පරාසයක තිබුණි.

(ණ) මණ්ඩලය මගින් රියදුරු අභ්‍යාස විද්‍යාල 19 ක් පවත්වාගෙන යන අතර ඉන් රියදුරු අභ්‍යාස විද්‍යාල 03 ක් ප්‍රධාන කාර්යාලය යටතේ ක්‍රියාත්මක වේ. සමාලෝචිත වර්ෂයේදී රියදුරු අභ්‍යාස විද්‍යාල මගින් රු.32,281,275 ක ආදායමක් උපයා තිබුණද මුළු වියදම රු. 37,841,849 ක් වූයෙන් රු. 5,560,574 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම අලාභය සියයට 63 කින් පමණ අඩුවී ඇති අතර රියදුරු අභ්‍යාස විද්‍යාලවල පුහුණු උපදේශක වරුන්ගේ හිඟය මෙන්ම පුහුණුව සඳහා යොදාගැනීමට ඇති වාහන හිඟය මෙම අලාභයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ත) 2014 වර්ෂයේ පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමත් සමඟම ඒ සඳහා ආනයනය කර තිබූ යූ ටෝන් වර්ගයේ අධි සුඛෝපභෝගී බස් රථ 68 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලැබී තිබුණු අතර එම බස් රථ මෙහෙයවීම සඳහා මොරටුව ඩිපෝවට සම්බන්ධ කර වෙනම ඒකකයක් ස්ථාපිතකර එම ඒකකය සඳහා බස් රථ 20 ක් ලබාදී තිබුණි.මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අධි සුඛෝපභෝගී බස් රථ 20ක් මගී ප්‍රවාහනයට ඵලදායීව යොදා ගැනීම සඳහා රියදුරු 32 දෙනෙකු සහ කොන්දොස්තරවරු 32 දෙනෙකු අවශ්‍ය වුවත් රියදුරන් 16 දෙනෙකු සහ කොන්දොස්තරවරු 12 දෙනෙකු පමණක් එම ඒකකයට අනුයුක්ත කර තිබීම නිසා රියදුරන් 16 දෙනෙකු සහ කොන්දොස්තරවරු 20 දෙනෙකුගේ ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ii) 2014 වර්ෂයේ අනතුරට පත්ව තිබුණු බස් රථ 02ක අලුත්වැඩියා කිරීම හා ඒ සඳහා රක්ෂණ වන්දි ලබා ගැනීම 2017 දෙසැම්බර් 26 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඔ) මණ්ඩලයේ ප්‍රධාන අරමුණ පොදු ප්‍රවාහන සේවා සඳහා බස් රථ යොදා ගනිමින් කාර්යක්ෂම මගී ප්‍රවාහන සේවාවක් පවත්වා ගැනීම වුවද එම අරමුණට පටහැනිව ගාස්තු අය කිරීමකින් තොරව 2014 ජනවාරි 31 දින මතුගම නගරයේ පැවති උත්සවයක් සඳහා කළුතර ප්‍රාදේශිකයට අයත් ඩිපෝ 06 කින් බස් රථ 47 ක් යොදවා තිබුණි.

## 4.2 අරමුදල් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ කටයුතු පහසු කර ගැනීමේ අරමුණ ඇතිව එක් එක් අරමුණ වෙනුවෙන් මණ්ඩලය විසින් ප්‍රධාන කාර්යාලයේ පමණක් ජංගම ගිණුම් 23 ක් ආරම්භ කර තිබුණු අතර ඉන් බැංකු ගිණුම් 9කින් එකතුව රු. 2,612,745,132 ක් අනෙකුත් ජංගම ගිණුම් 13 ක් වෙත මාරුකර තිබුණද එම මුදල් නැවත අදාළ බැංකු ගිණුම් වෙත ලබා ගෙන නොතිබුණි. ඒ අනුව අපේක්ෂිත අරමුණු ඉටු නොවී මණ්ඩලයේ මූල්‍ය කටයුතු තවදුරටත් සංකීර්ණ වීම මෙන්ම මූල්‍ය පාලන කටයුතු තවදුරටත් දුර්වල වී ගිණුම්කරණ ක්‍රියාවලිය සංකීර්ණ වීම පමණක් සිදු වී තිබුණි.

(ආ) බැංකු අයිරා පාලනය සිදු කිරීම සඳහා 2012 සැප්තැම්බර් 04 දින ප්‍රධාන කාර්යාලයේ වෙනම ජංගම ගිණුමක් ආරම්භ කර සියලුම බැංකු අයිරා ශේෂයන් මෙම ගිණුමට ගෙන තිබුණි. කෙසේවුවද 2014 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කාර්යාල හා ඩිපෝවල බැංකු ගිණුම් 147 එකතුව රු. 1,369,975,617 ක බැංකු අයිරාවක් පැවතුණි. ඒ අනුව මෙම ගිණුම ආරම්භ කිරීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු ඩිපෝ වෙත අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයෙන් ඇනවුම් කර තිබුණද සැපයුම්කරුවන් විසින් අදාළ භාණ්ඩ සෘජුවම ඩිපෝ වෙත ලබා දී තිබුණි. නමුත් ඩිපෝ විසින් භාණ්ඩ ලද වහාම අදාළ ඉන්වොයිස්පත් හා භාණ්ඩ ලැබීම් සහතික ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ මිලදී ගැනුම් අත්තිකාරම් ගිණුමෙහි 2014 දෙසැම්බර් 31 දිනට රු.1,831,859,235 ක නොපියවූ ශේෂයක් විය. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කළමනාකරණය විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර නීතිරීති පනවා නොතිබීමත්, ප්‍රමාණවත් අධීක්ෂණයක් නොකිරීමත්, කාලීනව සැසඳීම් නොකිරීමත් මෙයට හේතුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක නොරතුරු පරීක්ෂා කිරීමේ දී 2010 වර්ෂයේ රු. 2,095,483 ක් වූ කැෂියර් හිඟ ශේෂය 2011 වර්ෂයේ දී රු.1,538,920 දක්වා සුළු අඩුවීමක් පෙන්නුම් කළද 2012 වර්ෂයේදී එම හිඟය රු. 31,853,602 දක්වා හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.36,290,966 ක් දක්වා ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවතුණි. මෙම තත්ත්වය නිවැරදි කර ගැනීම පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) මඟී ටිකට් පොත් මඟින් සිදුවිය හැකි වැරදි සහ වංචා වළක්වා ගැනීම සඳහා අනුක්‍රමික අංක සහිතව ටිකට් පොත් සහ ටිකට් මුද්‍රණය කර එමඟින් අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතු වුවත්, මණ්ඩලය විසින් 2012 වර්ෂයේ දී රු.955,605 ක් වැයකර පෞද්ගලික ආයතනයක් වෙතින් මිලදී ගෙන තිබූ එක් පිටුවක ටිකට් පත් 10 බැගින් වූ පිටු 100 කින් යුක්ත මඟී ටිකට් පොත් 19,950 ක් අනුක්‍රමික අංක රහිතව මුද්‍රණය කර තිබුණි. මෙම මඟී ටිකට් පොත්වලින් 9,750 ක් ප්‍රාදේශීය කාර්යාලය වෙත නිකුත් කර තිබූ අතර පොත් 6,333 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඉහත දෝෂය නිසා ප්‍රධාන කාර්යාලයේ ගබඩාවට ආපසු එවා තිබුණද පොත් 3,417 ක් තවදුරටත් ප්‍රධාන කාර්යාලය වෙත ආපසු භාරදී නොතිබුණි. මේ සම්බන්ධයෙන් ඇතිවූ පාඩුව සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ආපසු භාර නොදුන් ටිකට් පොත්වලින් 500 ක් ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයට නිකුත්කර තිබූ අතර ඉන් පොත් 40 ක් මාර්ග ආදායම් රැස් කිරීම සඳහා බස් රථවලට නිකුත් කර ඉතිරි පොත් 460 ක් ප්‍රාදේශීය කාර්යාලයේ ගබඩාවේ රඳවාගෙන තිබුණි. ඒ අනුව අනුක්‍රමික අංක රහිත ටිකට් පොත් මඟින් පෙර නිකුත් කර තිබීම හා මාර්ග ආදායම් වංචා කිරීමට උපයෝගී කරගත හැකි එවැනි ටිකට් පොත් තවදුරටත් ගබඩාවල පවත්වාගෙන යාම අවධානම පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

(ඉ) මණ්ඩලය සතු රු. 319,799,319 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි වෙනුවෙන් අයිතිය තහවුරු කරන ලේඛනයන් විගණනය සඳහා ඉදිරිපත් නොවුණු අතර වත්කම් සමීක්ෂණයක් සිදුකර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට පියවර ගන්නා බව විගණන විමසුම්වලට පිළිතුරු වශයෙන් මෙන්ම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලද ප්‍රකාශ කර තිබුණද 2016 වර්ෂය අවසන් වන විටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙහි ප්‍රාදේශීය කාර්යාල 12 ට අදාළ ඩිපෝ 119 ක වාර්ෂික සමස්ථ මඟී ප්‍රවාහන ආදායම රු.31,461,130,501 ක් වූ අතර සමස්ථ වියදම රු.31,080,779,107 ක් වූයෙන් රු.379,531,394 ක දළ ලාභාන්තිකයක් පෙන්නුම් කළද ඩිපෝ 62 ක අලාභයන්ගේ එකතුව රු. 1,242,502,068 ක් වී තිබුණි. දෛනික කාලසටහන් අවශ්‍යතාවයට ප්‍රමාණවත්

බස්රථ නොමැතිවීම, කාර්මික දෝෂ සහ රියදුරු කොන්දොස්තර හිඟය වැනි හේතු නිසා දෛනිකව විශාල මාර්ග ආදායමක් මණ්ඩලයට අහිමිවී තිබුණි.

(ඇ) ක්‍රියාකාරී නොවන ශේෂ තුළ ඇතුළත් රු. 3,232,231,164 ක හර ශේෂ 66 ක් හා රු.2,010,924,185 ක බැර ශේෂ 23 ක් වූ නිශ්චල වත්කම් හා බැරකම් පිළිබඳව සම්පූර්ණ පරීක්ෂාවක් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනීම හා අනුමැතිය මත පොත්වලින් කපා හැරීමට 2002 ජූලි 30 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් දෙනු ලැබූ අනුමැතිය පරිදි 2012 වර්ෂයේදී එම වත්කම් හා වගකීම් පොත්වලින් කපා හැර තිබුණි. ඒ පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් සිදුකර නොතිබීම නිසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය නොලැබීම හේතුවෙන් නැවත 2013 වර්ෂයේදී ගිණුම්වලට ඇතුළත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය තෙක් එම ගැලපීම් නිවැරදි කර නොතිබුණි.

## 4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක සුභසාධනය සඳහා සේවක දඩ අරමුදල් ගිණුමෙන් සේවකයන් වෙත ලබා දී තිබූ ණයවලින් අයකර තිබූ රු. 84,733,235 ක ණය වාරික එම අරමුදලට බැර නොකර මණ්ඩලය තුළ රඳවාගෙන තිබුණි.

(ආ) මණ්ඩලීය අර්ථසාධක අරමුදලින් සේවකයින් වෙත ලබාදුන් ණය සඳහා සේවක වැටුපෙන් අඩුකර තිබූ රු.249,486,944 ක් අදාළ අරමුදල වෙත ලබා නොදී ආයතනයේ රඳවාගෙන තිබුණි. මණ්ඩලීය අර්ථසාධක අරමුදල වර්තමානය වන විට අහෝසි කර ඇති බැවින් මෙම මුදල් නිරවුල් කරන ආකාරය පිළිබඳ තොරතුරු විගණනයේ දී ගැටළු සහගත වී තිබුණි.

## 4.5 දූෂ්‍ය අක්‍රමිකතා

මණ්ඩලය විසින් දුනු කොළ සපයන සමාගමකට 2014 වර්ෂයේදී චෙක්පත් 66 කින් රු. 66,500,000 ක් ගෙවා තිබුණු අතර 2012 සහ 2013 වර්ෂවලදී එම සමාගම වෙත දුනු කොළ මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු. 30,550,000 ක් හා රු. 29,100,000 ක් ගෙවා තිබුණි. මෙම සමාගමට මුදල් ගෙවීමේදී මුදල් රෙගුලාසි 137 හා 138 පරිදි දුනු කොළ ලැබුණු බව තහවුරු කරගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් මුදල් ගෙවා තිබුණු රු.134,486,075 ක් වටිනාකමැති දුනුකොළ තවදුරටත් මණ්ඩලය වෙත භාරදී නොතිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අර්ථසාධක අරමුදලට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලට බැර කළයුතු පිළිවෙලින් රු. 625,095,955 ක් හා රු. 5,240,908,747 ක් සහ සේවක භාරකාර අරමුදල් දායකය රු.59,045,730 ක් නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් රු.89,743,024 ක් මුදලක් හා සේවක භාරකාර අරමුදල වෙනුවෙන් රු. 660,178 ක මුදලක් අධිභාර වශයෙන් ගෙවිය යුතුව තිබුණි.

(ආ) මහජන බැංකුවේ අනුමත බැංකු අයිරා පහසුකම රු.මිලියන 721.62 ක් වුවද 2014 දෙසැම්බර් 31 දින වන විට අයිරාව රු.මිලියන 745.22 ක් දක්වා වැඩිවී තිබුණි. බැංකු අයිරාව සඳහා මාසිකව සියයට 17 පොලී අනුපාතයක් යටතේ රු. 10,320,320 ක මාසික පොලියක් ගෙවනු ලබයි. බැංකු අයිරාව වෙනුවෙන් බැංකු සුරක්‍ෂණයක් ලෙස සියයට 8 ක පොලී අනුපාතයක් යටතේ රු. 325,000,000 ක ස්ථාවර තැන්පතුවක් හා සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුමක රු. 303,841,753 ක ශේෂයක් පවත්වාගෙන තිබුණි. තැන්පතු වෙනුවෙන් 2014 වර්ෂයේදී එකතුව රු. 39,647,172 ක් මණ්ඩලයට පොලී ආදායම් ලෙස ලැබුණද බැංකු අයිරාව සඳහා පොලී සහ බැංකු ගාස්තු ලෙස මණ්ඩලය විසින් රු. 84,196,667 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

## 4.7 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය අනුව රු.මිලියන 100 ට වැඩි මිලදී ගැනීම් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවක් මගින් ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වුවත් මණ්ඩලය විසින් රු.200,640,792 ක් වටිනා ඉලෙක්ට්‍රොනික් ටිකට් මැෂින් 4000 ක් මිලදී ගැනීමේ කටයුතු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ සඳහා තීරුබදු සහන යටතේ 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු. 1,415,503,290 ක අමතර කොටස් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මණ්ඩලයේ වාර්ෂික මූල්‍ය සීමාව සැලකීමේදී මෙම අමතර කොටස් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ඇගයීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කල ප්‍රසම්පාදන ඇගයීම් කමිටුවක් මගින් සිදුකල යුතු වුවත් ඊට පටහැනිව මාස 02 ක අවශ්‍යතාවය පමණක් සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුව මගින් සැපයුම්කරු තෝරාගෙන තිබුණු අතර එකම සැපයුම්කරුගෙන් 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මෙම මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ii) ඉහත විස්තර සඳහන් අමතර කොටස් මිලදී ගැනීමේදී සිදු වී තිබුණු අඩුපාඩු හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාල දෙකකට අදාල ඩිපෝ 26 ක අමතර කොටස් සඳහා නැවත මිල ගණන් කැඳවීමකින් තොරව ඊලග අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු සමාගම තෝරාගෙන සැපයුම් කොන්ත්‍රාතුව පවරා තිබුණි.

(iii) ඉහත අමතර කොටස් සැපයීමට තෝරාගත් සමාගම් දෙකම අදාල ගිවිසුම්වලට අනුව අමතර කොටස් ලබා දී නොතිබුණද එම සමාගම්වලට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව ඩිපෝවල ඒ ඒ අවස්ථාවේ අමතර කොටස් අවශ්‍යතාවයන් අනුව දේශීය ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් Fax මගින් ලබාගත් මිල ගණන් පදනම් කරගෙන සැපයුම්කරුවන් තෝරා ගෙන තිබුණු අතර අමතර කොටස් තොග වශයෙන් මිලදී ගැනීමක් සිදුකර නොතිබුණි. මේ නිසා තොග වශයෙන් ලබා ගැනීමේ දී ලබාගත හැකිව තිබූ ආර්ථික වාසි මණ්ඩලයට ලබාගත නොහැකි වී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ආසන 42 හා 54 බස් රථ 2,200 ක් ඉන්දියානු අශෝක් ලේලන්ඩ් සමාගම වෙතින් ඇමරිකානු ඩොලර් 72,620,000 කට හෙවත් ආසන්න වශයෙන් රු.10,331,775,516 ක් වූ මිලකට කල්බදු ක්‍රමය යටතේ 2014 වර්ෂයේ දී මිලදී ගෙන තිබුණි.මෙම බස් රථ 2,200 මිලදී ගැනීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 විධිවිධාන ප්‍රකාරව ජාත්‍යන්තර ලංසු කැඳවීමක් සිදු කර නොතිබුණු අතර තනි සැපයුම්කරුවෙකු විසින් ඉදිරිපත් කර තිබූ ලංසුව පදනම් කරගෙන අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ඇගයීම් කමිටුවක් මගින් ඇගයීම් කර ඒ අනුව මිලදී ගැනීම සිදු කර තිබුණි. එමෙන්ම මණ්ඩලය විසින් 2014 මැයි 16 දින එළඹී තිබුණු බස් රථ මිලදී ගැනීමේ කල්බදු ගිවිසුමට අනුව ණයවර ලිපි ඉදිරිපත් කර මාස 06 ක් තුළ අදාළ බස් රථ 2,200 සැපයීම සිදුකළ යුතු අතර ප්‍රමාද වීමේ දී ගිවිසුමේ 26.1 කොන්දේසි ප්‍රකාරව සියයට 0.01 ප්‍රමාද ගාස්තු අය කළ යුතු විය. නමුත් සැපයුම්කරු විසින් එකඟවී තිබුණු මුළු බස් රථවලින් බස් රථ 1,900 ක් පමණක් නියමිත කාලයට ලබා දී තිබුණු අතර ඉතිරි බස් රථ 300 ලබාදීමේ දී මාස 1 කුත් දින 21 ක් ප්‍රමාදකර තිබුණද ගිවිසුමේ සඳහන් පරිදි ඒ සඳහා ප්‍රමාද ගාස්තු රු.146,800 ක් අයකර නොතිබුණි.

### 4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව මණ්ඩලයේ ආරක්ෂක නිලධාරීන් 19 දෙනෙකු රේගීය අමාත්‍යාංශයට හා අනෙකුත් සේවකයින් 19 දෙනෙකු වෙනත් බාහිර ආයතනවලට මුදාහැර තිබූ අතර එම සේවකයින් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී පිළිවෙලින් වැටුප් වශයෙන් රු.3,146,776 ක් හා රු.1,351,400 ක් ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ආරක්ෂක නිලධාරීන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට, පුද්ගලික ප්‍රවාහන අමාත්‍යාංශයට, ජාතික ගමනාගමන කොමිෂන් සභාවට සහ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයට සේවයේ යොදවා තිබූ අතර ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනමින් සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් රු.40,401,906 ක් ගෙවා තිබුණද 2014 දෙසැම්බර් 31 දිනට එම මුදලින් රු.24,438,400 ක් පමණක් ප්‍රතිපූරණය කර තිබුණි. ඒ අනුව රු.15,936,506 ක් තවදුරටත් ප්‍රතිපූරණය කර ගත යුතුව පැවතුණි.

(ඇ) මණ්ඩලය විසින් මාසිකව රු.44,800 ක කුලී පදනමට ලබාගත් මෝටර් වාහන 05 ක් ප්‍රවාහන අමාත්‍යාංශයට හා නියෝජ්‍ය ප්‍රවාහන අමාත්‍ය කාර්යාලය වෙත මුදා හැර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් ඉන්ධන පිරිවැය හා වාහන කුලී වෙනුවෙන් පිළිවෙලින් රු.748,430 ක් හා රු. 1,142,400 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

### 4.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පිරිවැය රු. 97,462,160 බස්රථ 143 ක් 2002 වර්ෂයේදී පුද්ගලික ආයතනයක් වෙත පුනරුත්ථාපනය කිරීම සඳහා යවා තිබුණි. නමුත් එම ආයතනය මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයක නොපවතින බැවින් අදාළ බස්රථ නැවත මණ්ඩලයට ලැබීම පිළිබඳ අවදානමක් පැවතියද සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ඒ පිළිබඳ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

## 4.10 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඑස්/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 වෙනි පරිච්ඡේදයට අනුකූලව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා සංවිධාන සටහනක්,බඳවා ගැනීමේ පටිපාටියක් හා උසස්වීම් පටිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ඩිපෝවල රියදුරු හා කොන්දොස්තර තනතුරු අවශ්‍යතාවය හා වර්තමාන සිටින තථ්‍ය සංඛ්‍යාව අතර අතිරික්තය හා ඌනතාවය සැලකීමේදී රියදුරු තනතුරුවල සියයට 28 ක අතිරික්තයක සිට සියයට 35 ක ඌනතාවයක් දක්වා වූ පරාසයක විහිදී තිබුණු අතර කොන්දොස්තර තනතුරුවල සියයට 51 ක අතිරික්තයක සිට සියයට 36 ක ඌනතාවයක් දක්වා විහිදී පැවතුණි. කෙසේ වුවද කොන්දොස්තර හා රියදුරු තනතුරු සඳහා අතිරික්තව ඇති ඩිපෝ 25ක් වූ අතර එම අතිරික්ත කාර්ය මණ්ඩලය රියදුරු හා කොන්දොස්තර ඌනතාවය ඇති ඩිපෝවලට අනුයුක්ත කර රියදුරු කොන්දොස්තර හිඟය පියවා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.එමෙන්ම 2015 මැයි 01 දිනට මණ්ඩලයේ අනුචිත කාර්යයන්හි සේවයේ නියුක්තව සිටි කාර්ය මණ්ඩලය පිළිබඳව විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව රියදුරු සේවකයින් 235 ක් හා කොන්දොස්තර සේවකයින් 528 ක් අනුචිත කාර්යයන්හි යොදවා තිබුණි.

(ඇ) අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක ලෙස පත්කිරීම සඳහා මණ්ඩලයේ තථ්‍ය කාර්ය මණ්ඩලය තුළ I ශ්‍රේණියේ නිලධාරියෙකු නොවූයෙන් II ශ්‍රේණියේ නිලධාරියෙකු ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක ලෙස පත්කර තිබුණි,

(ඈ) ප්‍රාදේශීය කාර්යාලවල අභ්‍යන්තර විගණන අංශයේ III A ශ්‍රේණියේ නිලධාරියෙකු සිටිය යුතු වුවත් ගම්පහ, කළුතර, රජරට, රුහුණ සහ උතුර යන ප්‍රාදේශීය කාර්යාලවල III A ශ්‍රේණියේ නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවත් 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ වර්ෂ 01 මාස 11 ක් ප්‍රමාද වී එනම් 2017 ජනවාරි 31 දිනයේදිය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සැලසුම් කරන ලද කාලය තුළ අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි කළමනාකරණයේ වගකීම් පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගැනීමකින් තොරව ළඟා කරගත නොහැකි අරමුණු හා ඉලක්ක ඇතුළත් කර පිළියෙල කර තිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

2014 දෙසැම්බර් 31 දිනට අභ්‍යන්තර විගණන අංශයෙහි සමස්ථ කාර්ය මණ්ඩලය 183 ක් වූ අතර මින් සෘජුවම විගණනයට සම්බන්ධ කාර්ය මණ්ඩලය 154 ක් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය 27 ක් විය. ප්‍රධාන අභ්‍යන්තර විගණක හැර අනෙකුත් විගණන කාර්ය මණ්ඩලය 153 ක් වූ අතර එම නිලධාරීන් ප්‍රාදේශීය කාර්යාලයන් වෙත අනුයුක්ත කිරීමේදී විගණනයේ ඵලදායීතාවය වැඩිකරන ආකාරයට ප්‍රාදේශිකයන්ට අයත් ඩිපෝ සංඛ්‍යාව සැලකිල්ලට ගෙන නිලධාරීන් අනුයුක්ත කර නොතිබුණි.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය පරිදි මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, 4.2.1 (ආ) පරිදි අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද ඉදිරිපත් කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම එසේ සකස් කර නොතිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2014 වර්ෂයට පිළියෙල කර තිබූ අයවැය ලේඛනයේ තොරතුරු හා 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොරතුරු සැසඳීමට නොහැකි පරිදි එකිනෙකට වෙනස් ආකාරයට පිළියෙල කර තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පවතින්නේ ද යන්න සොයා බැලීමක් සිදු නොකරන බවට හා එය ආයතනයේ මූල්‍ය කටයුතු පාලනය කිරීම සඳහා කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා නොගන්නා බවට නිරීක්ෂණය විය.

(ආ) විගණනයේ දී සැසඳීම් කළ හැකි වූ ආදායම් වියදම් අයිතම කිහිපයක් පරීක්ෂා කිරීමේදී මණ්ඩලයේ ආදායම් සහ වියදම් අයිතමයන් 11 ක අයවැයගත වටිනාකම් සහ තථ්‍ය වටිනාකම් අතර සියයට 13 සිට සියයට 1621 දක්වා විචලනයන් පැවතුණි.

(ඇ) මණ්ඩලයේ අයවැයගත මුළු ආදායම රු.37,197,553,260 ක් වූ අතර තථ්‍ය මුළු ආදායම රු.32,780,242,592 ක් වුයෙන් රු.4,417,310,668 ක හෙවත් සියයට 11.87 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

(ඈ) මණ්ඩලයේ සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත මුළු වියදම රු.33,980,440,679 ක් වූ අතර තථ්‍ය මුළු වියදම රු.34,042,371,040 ක් වුයෙන් රු.61,930,361 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

## 5.6 පාරිසරික හා සමාජ වගකීම ඉටුකිරීම

අංක 1533/17 දරණ 2008 ජනවාරි 25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව මෝටර් වාහන පනත (203 වන අධිකාරිය) මගින් දක්වා ඇති නියෝග අංක 3 හි (ඇ) යටතේ ශ්‍රී ලංකාවේ භාවිතා කරනු ලබන සෑම මෝටර් වාහනයක්ම වායු විමෝචන පරීක්ෂාවට ලක් කර අනුකූලතා සහතිකයක් ලබා ගත යුතුය. මහනුවර ප්‍රාදේශිකය මගින් පමණක් විගණනයට ලබා දුන් තොරතුරු අනුව එම ප්‍රාදේශිකයට අයත් ඩිපෝ 07ක මුළු බස් රථ සංඛ්‍යාව වූ 595 කින් බස් රථ 135 ක් පමණක් දුම් සහතික ලබා ගෙන තිබුණු අතර බස් රථ 460 ක් දුම් පරීක්ෂාවකින් තොරව දෛනිකව ධාවනයේ යෙදී තිබුණි. මේ නිසා මණ්ඩලයේ බස්රථවලින් මහනුවර ප්‍රදේශයේ පරිසර දූෂණයට බලපෑමක් සිදුවී නැතැයි විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | මණ්ඩලයේ බස් රථවල විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොගැනීම. |
| | | (ii) | වත්කම්වල ආරක්ෂාව ඇතිවන පරිදි භාරකාරත්වය නොපැවරීම. |
| | | (iii) | වත්කම් මිලට ගැනීම හා ගිණුම්ගත කිරීමේ අභ්‍යන්තර පාලනය දුර්වල වීම. |
| | | (iv) | වාර්ෂික සත්‍යාපනයන් නොකිරීම. |
| (ආ) | මූල්‍ය පාලනය | (i) | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු නොකිරීම හා ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ විගසම පියවීමට කටයුතු නොකිරීම හා වගකිව යුතු නිලධාරියෙකු විසින් අධීක්ෂණය නොකිරීම. |
| | | (iii) | අත්තිකාරම් ලේඛන පවත්වා නොගැනීම |
| | | (iv) | සේවක ඇප තැන්පත් සඳහා ලේඛන පවත්වා නොගැනීම හා සේවක ඇප තැන්පත් මුදල් මණ්ඩලයේ වියදම් සඳහා යොදා ගැනීම. |
| | | (v) | මුදල් අංශය විසින් අවශ්‍යතාවයකින් තොරව බැංකු ගිණුම් පවත්වාගෙන යාම, සැසඳුම් නොකිරීම හා ගැලපීම් නොකිරීම. |
| (ඇ) | ආදායම් පාලනය | | ගමන් බලපත්‍ර ආදායම් එකතු කිරීම සඳහා අනුක්‍රමික අංක සහිත මුද්‍රිත ඉන්වොයිස් පත්‍ර භාවිතා නොකිරීම. |
| (ඈ) | ගබඩා පාලනය | (i) | ගබඩාවට ලැබෙන භාණ්ඩ වගකිව යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක් නොවීම. |

(ii) දිර්ඝ කාලයක සිට පැවතෙන පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු නොකිරීම.

(iii) ප්‍රධාන කාර්යාලයෙන් ඇනවුම්කර ඩිපෝව වෙත සෘජුවම සපයන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලයට නිසි පරිදි වාර්තා නොකිරීම.

(iv) ගබඩා දත්ත හා ඩිපෝවල දත්ත සැසඳීම් නොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති